වාර්ෂික වාර්තාව - 2017

ஆண்டறிக்கை - 2017

Annual Report - 2017

හෝමියෝපති වෛද්‍ය සභාව

ஹோமியோபதி மருத்துவ சபை

Homoeopathic Medical Council



වාර්ෂික වාර්තාව

2017

හෝමියෝපති වෛද්‍ය සභාව

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය

අමාත්‍යාංශය

පටුන

පිටුව

1. සාරාංශය 02

2. හැඳින්වීම 03

3. හෝමියෝපති වෛද්‍ය සභාව 04

4. පසුබිම් විස්තරය 05

5. වෛද්‍ය සභාවේ අරමුණු 07

6. වෛද්‍ය සභාව සතු බලතල 08

7. වෛද්‍ය සභාවේ සාමාජිකත්වය සහ ධුර කාලය 10

8. සංස්ථාපිත තොරතුරු 11

9. වෛද්‍ය සභාවේ ක්‍රියාකාරී සැලැස්ම - 2017 12

10. හෝමියෝපති වෛද්‍ය සභාවේ කාර්ය සාධනය 14

11. වාර්ෂික ගිණුම් වාර්තා 24

12. විගණන වාර්තාව

සුභාසිංශන

01. සාරාංශය

පෙර වර්ෂවලදී මෙන්ම හෝමියෝපති වෛද්‍ය සභාවේ දැක්ම, මෙහෙවර සහ අරමුණු ඇගයීමට ලක් කිරීමේ පදනම සැකසීමේ අරමුණින් වසරේ සමස්ත ක්‍රියාකාරීත්වය ඇතුළත් 2017 වාර්තාව මෙමඟින් ඉදිරිපත් කෙරේ.

මෙම වසරේදී හෝමියෝපති වෛද්‍ය සභාවේ කටයුතු මෙහෙයවනු ලැබුවේ 2016 අංක 10 දරණ හෝමියෝපති පනත යටතේ පිහිටවනු ලැබූ ප්‍රථම පාලක සභාව වූ හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව විසිනි. සභාවේ ගිණුම් කටයුතු රේඛීය අමාත්‍යාංශය වූ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ දේශීය වෛද්‍ය අංශය විසින් මෙහෙයවනු ලැබීය.

2016 අංක 10 දරණ නව හෝමියෝපති පනත බලාත්මක කිරීම සඳහා අවශ්‍ය රීති හා රෙගුලාසි සම්පාදනය සිය ප්‍රධාන වගකීම ලෙස ගත් අතුරු වෛද්‍ය සභාව ගරු අමාත්‍යතුමා විසින් සාදනු ලබන නියෝග කෙටුම්පත් කර ඉදිරිපත් කිරීමට ප්‍රමුඛ අවධානයෙන් කටයුතු කළේය. මෙහිදී, නව පනත යටතේ හෝමියෝපති වෛද්‍ය සභාව පත් කර ගැනීම සඳහා වන නියෝග, හෝමියෝපති වෛද්‍යවරුන්, පරිපූරක වෛද්‍ය වෘත්තිකයින්, ප්‍රතිකාර වෛද්‍ය මධ්‍යස්ථාන සහ විවිධ සේවාවන් සපයන හෝමියෝපති ආයතන ලියාපදිංචිය හා ඒවායෙහි ලියාපදිංචිය යාවත්කාලීන කිරීම සඳහා වන නියෝග කෙටුම්පත් කෙරුණි. එමෙන්ම පනතේ 30 වන වගන්තිය ප්‍රකාරව පැවැත්විය යුතු හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයින් ලියාපදිංචි කිරීම සඳහා වන විභාගයේ රීති සම්පාදනය ද මෙම වසර තුළ නිමකර අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී. මෙලෙස 2016 අංක 10 දරණ නව හෝමියෝපති පනතින් එහි ප්‍රථම මෙහෙයුම් සභාව වන හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව වෙත පවරා දී ඇති කාර්ය භාරය මැනවින් ඉටුකිරීමට ක්‍රියාකළ වසරක් ලෙස මෙම වසර හැඳින්විය හැකිය.

වෛද්‍ය සභාව මඟින් පවත්වාගෙන යනු ලබන රජයේ හෝමියෝපති සායන 7 හි පුරප්පාඩුව පැවති කාර්යාල සහායක තනතුරු 7 සඳහා බඳවා ගනිමින් වෛද්‍ය සභාවේ ආයතනික ව්‍යුහය ශක්තිමත්ව පුළුල් කිරීමට මෙම වසරේ දී ක්‍රියා කරනු ලැබීය. සායන 7 මඟින් ලබා දෙන ප්‍රතිකාර වල ප්‍රමාණාත්මක හා ගුණාත්මක වර්ධනයක් පෙර වසරට සාපේක්ෂව අත්පත් කරගෙන තිබුණි. හෝමියෝපති උපාධිධාරී නව වෛද්‍යවරුන් 4 දෙනෙකුට ලියාපදිංචිය ලබා දී මෙතෙක් හෝමියෝපති වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව 281 දක්වා වර්ධනය කර ගන්නා ලදී. පනතේ 30 (1) වගන්තිය ප්‍රකාරව වෛද්‍ය වෘත්තිකයින් ලියාපදිංචි කිරීම සඳහා වන විභාගය වෙනුවෙන් අයදුම්පත් කැඳවා ඇති අතර 185 දෙනෙක් අයදුම්පත් යොමුකර තිබුණි. මේ ආකාරයට වෛද්‍ය සභාවේ සමස්ත කාර්යභාරය සම්බන්ධයෙන් ගත් කල ආයතනය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පරිපාලන හා මූල්‍යමය ක්‍රියාවලීන් මූලික වශයෙන් විගණකාධිපති වරයාගේ වාර්තාව මඟින් ඇගයීමට ලක්ව ඇත.

02.හැඳින්වීම

“ සමාන දෙයින් සමාන දෙය නැසීම ”යන ස්වාභාවික මූලධර්මය මත පදනම් වූ වෛද්‍ය ක්‍රමයක් ලෙස හෝමියෝපති වෛද්‍ය ක්‍රමය හැඳින්විය හැකිය. 18 වන සියවසේ දී මෙම වෛද්‍ය ක්‍රමය ලොවට හඳුන්වා දෙනු ලැබුවේ බටහිර වෛද්‍ය ක්‍රමයේ විශේෂඥයෙකු වූ ජර්මන් ජාතික ක්‍රිස්ටියන් ෆෙඩ්රික් හානිමාන් විසිනි. අද වනවිට විද්‍යාත්මකව හා තාක්ෂණිකව වර්ධනය වෙමින් පවතින හෝමියෝපති වෛද්‍ය ක්‍රමය මහජන සෞඛ්‍ය සේවාව තුළ ප්‍රබල ස්ථානයකට පත් කිරීමට කටයුතු සිදුකරමින් පවතී. ඒ අනුව ඉන්දියානු රජය හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ජාතික සෞඛ්‍ය සේවයට අනුයුක්ත කර, රටපුරා විහිදුණු හෝමියෝපති රෝහල් පද්ධතියක් මඟින් එරට මහජන සෞඛ්‍ය සේවා පැවැත්වීමට පමණක් සීමා නොවී, හෝමියෝපති වෛද්‍ය උපාධි ප්‍රදානය කරන විශ්ව විද්‍යාල, හෝමියෝපති ඖෂධ නිෂ්පාදන කරන කර්මාන්ත ශාලා සහ හෝමියෝපති පර්යේෂණ ආයතන බිහිකර තිබීම මඟින් මෙම කරුණ මොනවට පැහැදිලි කෙරේ.

1970 අංක 07 දරණ හෝමියෝපති පනත මගින් මුලින්ම ශ්‍රී ලංකා හෝමියෝපති වෛද්‍ය සභාව ස්ථාපනය කළ අතර එය හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කිරීමේ සහ වර්ධනය කිරීමේ භාරධූර කාර්යයට උර දී ඇත. එහෙත් එහිදී පැන නැඟි නීතිමය හා ව්‍යුහාත්මක බාධාවන් ඉදිරියේ අවසාන වශයෙන් වෛද්‍ය සභාව බිඳ වැටුණි. කෙසේ වෙතත් මෙම අභියෝගයන් ජය ගැනීමේ අරමුණ ද සහිතව 2016 අංක 10 දරණ හෝමියෝපති පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කෙරුණි. මෙම නව පනතේ I කොටසේ 2 වගන්තිය ප්‍රකාරව හෝමියෝපති වෛද්‍ය සභාව යළි පිහිටුවීම සඳහා වන කර්තව්‍යයන් ඉටු කිරීම පිණිස, පනතේ 51 වගන්තිය අනුව හෝමියෝපති වෛද්‍ය සභාවේ මුල් ස්වරූපය ලෙස ගැනිය හැකි හෝමියෝපති අතුරු වෛද්‍ය සභාවක් 2016 වසරේ දී ස්ථාපිත කරන ලදී. ගරු අමාත්‍යතුමා විසින් පත් කරන ලද, හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව හෝමියෝපති වෛද්‍යවරුන් 04 දෙනෙකුගෙන් සහ රාජ්‍ය නිලධාරීන් 6 දෙනෙකුගෙන් සමන්විත විය. හෝමියෝපති වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරී මෙම සභාවේ ලේකම්වරයා වේ.

හෝමියෝපති වෛද්‍ය සභාවේ අරමුණු සාධනයෙහි ලා එහි කාර්ය භාරය යටතට ගැනෙන හෝමියෝපති වෛද්‍ය ක්‍රමය මහජන සෞඛ්‍ය සේවාවක් ලෙස ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දිස්ත්‍රික් 07 ක රජයේ හෝමියෝපති සායන 07 ක් ස්ථාපිත කර ඇත. දෙහිවල, පරකඩුව, මොණරාගල, පාලමුනෙ, මාතලේ, කුරුණෑගල, හා තෝලංගමුව මෙසේ වෛද්‍ය සභාව මඟින් රජයේ හෝමියෝපති සායන පවත්වාගෙන යනු ලබන ස්ථාන වේ.

03. හෝමියෝපති වෛද්‍ය සභාව

දැක්ම

“හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ජාතික සෞඛ්‍ය සේවාවක් දක්වා ප්‍රවර්ධනය කිරීම”

මෙහෙවර

“හෝමියෝපති වෛද්‍ය ක්‍රමය අරභයා මානව හා භෞතික සම්පත් වර්ධනය කිරීම සම්බන්ධ නිසි ප්‍රතිපත්ති සම්පාදනය කරමින්, එය පොදු ජනතාව අතර ප්‍රචලිත කිරීම, නගා සිටුවීම හා අභිවර්ධනය කිරීම.”

පරමාර්ථ

2016 අංක 10 දරණ හෝමියෝපති පනතේ විධි විධාන වලට අනුකූලව හෝමියෝපති ක්ෂේත්‍රයේ වෘත්තීය අධ්‍යාපන හා සෞඛ්‍ය සේවාව ගුණාත්මකව සංවර්ධනය කිරීම හා දැනුම, කුසලතා හා පළපුරුද්ද සහිත වෘත්තිකයන් මඟින් රෝගීන්ගේ නිරෝගීභාවය ප්‍රතිස්ථාපනය කිරීම හා නිරෝගී පුද්ගලයන්ගේ නිරෝගීභාවය සංරක්ෂණය කිරීම සඳහා වෘත්තීමය නෛතික අධිකාරීත්වය පිරිනැමීම මඟින් වෘත්තීය ගෞරවය හා ගුණාත්මකභාවය සුරක්ෂිත කිරීම.

04. පසුබිම

හෝමියෝපති වෛද්‍ය සභාව ව්‍යවස්ථාපිත ආයතනයකි. ප්‍රථම වෛද්‍ය සභාව **හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව** ලෙස 2016 අංක 10 දරණ හෝමියෝපති පනත මඟින් නම් කෙරෙන අතර එහි සාමාජිකයන් පත් කිරීමේ බලය ගරු අමාත්‍යතුමා වෙත පැවරී ඇත. තදනන්තර වෛද්‍ය සභාවන් නිල බලයෙන් පත් කෙරෙන රාජ්‍ය නිලධාරීන් තිදෙනෙකු, හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් අතර ජන්දයෙන් තෝරා ගැනෙන සාමාජිකයින් පස් දෙනෙකු, හෝමියෝපති වෛද්‍යවරුන් දෙදෙනෙකු අනිවාර්යයෙන් ඇතුළත් වන සේ ගරු අමාත්‍යතුමා විසින් පත් කෙරෙන තිදෙනෙකු ඇතුළත් 11 දෙනෙකුගෙන් සැදුම්ලත් මණ්ඩලයකින් සමන්විත වේ. පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා වන නියෝග සෑදීමේ බලය ගරු අමාත්‍යතුමා සතු වන අතර නියම කර ඇති ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පනතට අනුකූලව රීති සම්පාදනය කිරීමේ බලය සභාව වෙත පවරනු ලැබ ඇත.

නීති සහ රෙගුලාසි

2016 අංක 10 දරණ නව හෝමියෝපති පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයේදී බලාත්මකව පැවති සෑම නියෝගයක්ම, මෙම පනත යටතේ නියෝග සාදන තෙක්, මෙම පනත ප්‍රකාරව සාදන ලද නියෝග ලෙස පනතට අනුකූලව සැලකේ. නව පනත යටතේ අවශ්‍ය නියෝග සම්පාදනය සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට සිදුකරමින් පවතින හෙයින් 1970 අංක 07 දරණ හෝමියෝපති පනත යටතේ බලාත්මකව පැවති නියෝග මේ අනුව තවදුරටත් වලංගුව පවතී.

1970 අංක 07 දරණ හෝමියෝපති පනතට අනුව ප්‍රකාශයට පත් කර ඇති නියෝග

1. හෝමියෝපති රෙගුලාසි - 1980
   (වෛද්‍ය වෘත්තිකයින් ලියාපදිංචි කිරීමේ
   රෙගුලාසි සහ හෝමියෝපති ඖෂධ ආනයනය)
2. හෝමියෝපති වෛද්‍ය සභාවේ නීති - 1981
3. හෝමියෝපති වෛද්‍ය සභා මැතිවරණ රෙගුලාසි - 1998

හෝමියෝපති වෛද්‍ය සභාව ස්ථාපිත කිරීම

මෙරට මුලින්ම හෝමියෝපති වෛද්‍ය සභාවක් පත්කර ඇත්තේ, 1970 අංක 07 දරණ හෝමියෝපති පනතට අනුකූලව, 1979 වසරේ දී විෂය භාර ගරු අමාත්‍යතුමා විසිනි. එම පනතට අනුව වසර 5 කට වරක් වෛද්‍ය වෘත්තිකයන්ගේ ඡන්දයෙන් වෛද්‍ය සභාව පත් කර ගත යුතු (පළමු වෛද්‍ය සභාව හැර) වුවද අඛණ්ඩව වෛද්‍ය සභාව පත් කර ගනු ලැබීමක් සිදුව නොතිබුණි. 1979 ට පසුව දෙවැනි වෛද්‍ය සභාව 1998 දීත්, තෙවැන්න 2006 දීත් වශයෙන් පත්ව ඇති අතර තුන්වෙනුව පත් කෙරුණ වෛද්‍ය සභාව 2009 දී නිල කාලය නිමවීමට පෙර විෂයභාර අමාත්‍යතුමා විසින් විසුරුවා හැර ඉතිරි වසර දෙකක කාලය සඳහා නව වෛද්‍ය සභාවක් පත් කරන ලදී.

එහි නිල කාලය 2011 ජනවාරි 30 දිනෙන් අවසන් විය. ඒ වන විට බල පැවති හෝමියෝපති පනතේ දුර්වලතා මගහැර නව පනතක් ගෙන එන තෙක් වෛද්‍ය සභාවේ කටයුතු පවත්වාගෙන යාම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියක් මත ගරු අමාත්‍යතුමා හෝ අමාත්‍යාංශ ලේකම්වරයා හෝ මඟින් හෝමියෝපති අතුරු පාලක කමිටු පත් කෙරුණි. 2011 ජුනි 16 වැනි දින සිට 2016 අංක 10 දරණ නව හෝමියෝපති පනත හඳුන්වා දුන් 2016 ජුලි 29 තෙක්ම හෝමියෝපති වෛද්‍ය සභාවේ කටයුතු මෙහෙයවනු ලැබුවේ අතුරු පාලක කමිටුවක් මඟිනි. මෙසේ පත් කෙරුණු අතුරු පාලක කමිටු සංඛ්‍යාව 05කි. මෙම කාල වකවානුව පුරාම හෝමියෝපති වෛද්‍යවරුන්ගේ තාක්ෂණික කමිටුවක සහාය හෝමියෝපති අතුරු පාලක කමිටුවට ලැබුණි.

හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව

2016 අංක 10 දරණ නව හෝමියෝපති පනත සම්මත වීමෙන් පසුව 2016 ඔක්තෝබර් මස 21 දින සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය ගරු අමාත්‍යතුමා විසින් පනත මඟින් ඔහු වෙත ලබා දී ඇති බලතල වලට අනුකූලව හෝමියෝපති අතුරු වෛද්‍ය සභාවක් පත් කරන ලදී. පනතට අනුව මුලින්ම පත් කෙරෙනුයේ හෝමියෝපති අතුරු වෛද්‍ය සභාවය. එහි නිල කාලය වසර දෙකකි. පනත බලාත්මක කිරීමට අත්‍යාවශ්‍ය වන නියෝග සම්පාදනයට අදාළ මූලික කෙටුම්පත් සකසා සම්මත කරවා ගැනීම මෙම සභාවේ ප්‍රමුඛ කාර්ය ලෙස සැලකේ.

05. වෛද්‍ය සභාවේ අරමුණු

2016 අංක 10 දරණ හෝමියෝපති පනතට අනුව හෝමියෝපති වෛද්‍ය සභාවේ අරමුණු පහත සඳහන් පරිදි

1) හෝමියෝපති වෛද්‍ය වෘත්තියෙහි යෙදීම ප්‍රවර්ධනය කිරීම, අභිවර්ධනය කිරීම සහ නියාමනය කිරීම;
2) හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට අනුව මහජන සෞඛ්‍ය වර්ධනය කිරීමේ අරමුණ ඇතිව සමාජය තුළ හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ප්‍රවර්ධනය කිරීම;
3) හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳ අධ්‍යයනය කිරීම, පර්යේෂණ කිරීම සහ හෝමියෝපති වෛද්‍ය වෘත්තියේ යෙදීම ප්‍රවර්ධනය කිරීම සහ උනන්දු කරවීම;
4) හෝමියෝපති ආයතනයන් පිහිටුවා පවත්වා ගෙන යාම;
5) රජයේ හෝමියෝපති රෝහල හැර හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට අනුව ප්‍රතිකාර ලබාදෙන හෝමියෝපති ආයතන නියාමනය කිරීම සහ පාලනය කිරීම;
6) හෝමියෝපති බෙහෙත් වර්ග, ඖෂධ සහ වෙනත් පිළියෙල කිරීම්, නිෂ්පාදන, ආනයනය, ගබඩා කිරීම, විකිණීම සහ බෙදා හැරීම නියාමනය කිරීම සහ පාලනය කිරීම.

06. වෛද්‍ය සභාවේ බලතල

පනතේ 16 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් බලතල හෝමියෝපති වෛද්‍ය සභාව සතුවේ.

01) හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන්, හෝමියෝපති ඖෂධවේදීන්, හෝමියෝපති හෙදියන්, සහ හෝමියෝපති ආයතන ලියාපදිංචි කිරීම;

02) හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම;

03) හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් වෙත සුදුසුකම් ප්‍රදානය කළ ආයතන වෙතින් ඒ පිළිබඳ සහතික කරවා ගැනීම;

04) හෝමියෝපති වෛද්‍ය විද්‍යාල හෝ ආයතන නියාමනය කිරීම සඳහා පරීක්ෂකවරුන් පත් කිරීම;

05) හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට අනුකූලව ප්‍රතිකාර සේවා සැපයීම;

06) හෝමියෝපති ආයතන පිහිටුවීම, පවත්වා ගෙන යාම සහ පශ්චාත් අධ්‍යයන පාඨමාලා සකස් කිරීම;

07) හෝමියෝපති ඖෂධ ආනයනය හෝ අපනයනය;

08) හෝමියෝපති ඖෂධ විද්‍යාත්මකව නිෂ්පාදනය කිරීම හා දිරිමත් කිරීම;

09) හෝමියෝපති වෛද්‍ය පහසුකම්, උපකරණ, පාඨමාලා හා විභාග සම්බන්ධ අවම ප්‍රමිති නියම කිරීම හා පවත්වා ගෙන යාම;

10) හෝමියෝපති විෂය හදාරන්නන්ට ශිෂ්‍යත්ව සහ වෙනත් පහසුකම් ප්‍රදානය කිරීම, හෝමියෝපති පර්යේෂණ ආයතන දිරිමත් කිරීම, අවශ්‍ය ආයතන සහ පුද්ගලයින් සඳහා මූල්‍යාධාර හෝ වෙනත් සහන ලබාදීම;

11) පශ්චාත් උපාධි හෝමියෝපති වෛද්‍ය අධ්‍යාපනය සම්බන්ධ වෛද්‍ය අධ්‍යාපන අවම ප්‍රමිති නියම කිරීම හා පවත්වා ගෙන යාම;

12) හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට අනුකූලව මහජන සෞඛ්‍ය සේවාව වැඩිදියුණු කිරීම;

13) වෛද්‍ය විද්‍යාවට සම්බන්ධ උපාධි හා අනෙකුත් අධ්‍යාපන විශිෂ්ටතා ප්‍රදානය කිරීම සඳහා උසස් අධ්‍යාපන ආයතන සමඟ කටයුතු කිරීම;

14) 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතට අනුකූලව හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් පිහිටුවීම සම්බන්ධයෙන් කටයුතු කිරීම;

15) සභාවේ කාර්යය සහ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි මණ්ඩල හා කමිටු අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව පිහිටුවීම;

16) නිලධරයෙකු හෝ කමිටුවක් වෙත යම් බලතල හෝ කාර්යයන් පැවරීම;

17) සභාවේ බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා රීති සෑදීම;

18) පනත යටතේ බලතල හා කාර්යය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම;

07. වෛද්‍ය සභාවේ සාමාජිකත්වය හා ධුර කාලය

2016 අංක 10 දරණ හෝමියෝපති පනතට අනුව වෛද්‍ය සභාවේ සාමාජික සංඛ්‍යාව සභාපති ද ඇතුළුව 11 කි. නිල බලයෙන් පත් වන රේඛීය අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු, භාණ්ඩාගාරයේ නියෝජිතයෙකු, සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නියෝජිතයෙකු ගෙන් සමන්විත රාජ්‍ය නිලධාරීන් තිදෙනෙකු, හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් අතරින් ජන්දයෙන් තෝරා ගැනෙන පස් දෙනෙකු සහ හෝමියෝපති වෛද්‍යවරුන් දෙදෙනෙකු ද අනිවාර්යෙන් ඇතුළත් වන පරිදි ගරු අමාත්‍යතුමා විසින් පත් කරනු ලබන තිදෙනෙකු සහිතව සාමාජිකයින් 11 දෙනා පත් කෙරේ. වෛද්‍ය සභාවේ ලේකම්/ලේඛකාධිකාරී ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය මත පත් කරනු ලබන්නේ සභාව විසිනි. සභාව වසර තුනක් සඳහා පත් කෙරෙන අතර ලේකම්/ලේඛකාධිකාරී වසර 5 ක් සඳහා පත් කෙරේ.

08. සංස්ථාපිත තොරතුරු

ආයතනයේ නම	:-	හෝමියෝපති වෛද්‍ය සභාව
ලිපිනය	:-	අංක 94, ෂෙල්ටන් ජයසිංහ මාවත, වැලිසර, රාගම.
දුරකතන අංකය	:-	011-2958175
ෆැක්ස්	:-	011-2958175
විද්‍යුත් තැපෑල		homosri.mcouncil@gmail.com
සංස්ථාපිත ආයතනයේ තත්ත්වය	:-	2016 අංක 10 දරණ හෝමියෝපති පනතේ 15,16 හා 17 වගන්ති ප්‍රකාර අරමුණු හා බලතල මත හෝමියෝපති වෛද්‍ය සභාව ස්ථාපිත කර ඇත.
පරිපාලන ව්‍යුහය	:-	ලේකම් / ලේඛකාධිකාරී කාර්යභාර වෛද්‍යවරු කළමනාකරණ සහකාර ඖෂධ සංයෝජක කාර්යාල සහායක
බැංකුකරුවෝ	:-	ලංකා බැංකුව - තැප්රොබේන් ශාඛාව, කොළඹ කොමර්ෂල් බැංකුව - ජා ඇල

09. වෛද්‍ය සභාවේ ක්‍රියාකාරී සැලැස්ම - 2017

ඉලක්ක අංක 01

2016 අංක 10 දරණ හෝමියෝපති පනතේ විධිවිධාන බලාත්මක කිරීම.

උපාය මාර්ග

නීති රීති හා රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීම.

ඉලක්ක අංක 02

01. පනතේ අංක 30 / 1 දරණ විධිවිධාන යටතේ වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම.
02. හෝමියෝපති සෞඛ්‍ය සත්කාර සේවාව විධිමත් කිරීම සඳහා අවශ්‍ය පරිපූරක සෞඛ්‍ය සේවකයන් පුහුණු කිරීම.
03. වෘත්තීය පිළිගැනීම ලබා දීම හා ලියාපදිංචි කිරීම.

උපාය මාර්ග

- අයදුම්පත් කැඳවීම.
- විභාග මණ්ඩලයක් පත් කිරීම.
- විභාග පැවැත්වීම.
- සමත් වූවන් ලියාපදිංචි කිරීම.
- පරිපූරක සෞඛ්‍ය සේවකයන් පුහුණු කිරීම.
- වෘත්තීය පිළිගැනීම ලබා දීම හා ලියාපදිංචි කිරීම

ඉලක්ක අංක 03

පනතේ විධි විධාන යටතේ හෝමියෝපති සෞඛ්‍ය සේවා සපයන ආයතන ලියාපදිංචි කිරීම.

උපාය මාර්ග

නීති රීති හා නිර්ණායක සම්පාදනය

ඉලක්ක අංක 04

පනතේ විධි විධාන යටතේ හෝමියෝපති ඖෂධ ආනයනය කර වෛද්‍යවරුන්ගේ අවශ්‍යතාවයන් සපුරාලීම.

උපාය මාර්ග

- අවශ්‍යතාවයන් හඳුනා ගැනීම.
- සැපයුම් කරුවන් තෝරා ගැනීම.
- මිල ගණන් කැඳවීම.
- ආනයනය කිරීම.

ඉලක්ක අංක 05

පනතේ විධි විධාන යටතේ රජයේ හෝමියෝපති සායන විධිමත් කිරීම හා ප්‍රවර්ධනය කිරීම

උපාය මාර්ග

- සේවකයන් බඳවා ගැනීම.
- වැටුප් දීමනා හා සේවක සංඛ්‍යා අනුමත කර ගැනීම.
- කාර්ය සාධනය
- දැනුම හා කුසලතා ප්‍රවර්ධනය
- නව සායන ආරම්භ කිරීම හා සේවා ව්‍යාප්ත කිරීම.

ඉලක්ක අංක 06

පනතේ විධි විධාන යටතේ රජයේ හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කිරීමට අවශ්‍ය රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීම.

උපාය මාර්ග

- අවශ්‍යතාවයන් හඳුනා ගැනීම හා ජාතික ප්‍රතිපත්තියක් තීරණය කර ගැනීම.
- විදෙස් හෝමියෝපති වෛද්‍ය විද්‍යාල ව්‍යුහයන් අධ්‍යනය කිරීම.
- විශ්ව විද්‍යාල කොමිෂන් සභාවේ නිර්ණායකයන් හා කොන්දේසි හඳුනා ගැනීම.
- උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම.
- රෙගුලාසි සම්පාදනය කිරීම.
- අනුමත කර ගැනීම හා ප්‍රකාශයට පත් කිරීම.

10. හෝමියෝපති වෛද්‍ය සභාවේ කාර්ය සාධනය

(2017.01.01 – 2017.12.31)

01. රජයේ හෝමියෝපති සායනවල කාර්ය සාධනය සහ කළමනාකරණය.



කුරුණෑගල රජයේ හෝමියෝපති වෛද්‍ය මධ්‍යස්ථානයේ මෙහෙයවීමෙන් පැවති දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ජංගම සායනයක් .

1.1. රජයේ හෝමියෝපති සායනවල කාර්ය සාධනය .

මෙම වසරේ දී රජයේ හෝමියෝපති සායන 07 වෙත රෝගීන්ගේ පැමිණීම පහත සඳහන් පරිදි වේ.

සායනය	පැමිණි රෝගීන් ගණන
දෙහිවල සායනය	15,651
පරකඩුව සායනය	9,733
මොණරාගල සායනය	4,760
පාලමුනෙ සායනය	11,487
කුරුණෑගල සායනය	9,196
මාතලේ සායනය	9,816
තෝලංගමුව සායනය	12,730
වාර්ෂිකව පැමිණි රෝගීන් ගණන	**73,373**

1.2. රජයේ හෝමියෝපති සායන කළමනාකරණය.

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය මහජන සෞඛ්‍ය සේවාවක් ලෙස ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් වෛද්‍ය සභාව විසින් දැනට දිස්ත්‍රික්ක 07 ක පවත්වාගෙන යනු ලබන රජයේ හෝමියෝපති සායන 07 සඳහා පහසුකම් සපයමින් ඒවායෙහි ප්‍රමාණාත්මක හා ගුණාත්මක වර්ධනය ඉහළ නැංවීම සඳහා පියවර ගනු ලැබීය. මේ යටතේ සේවක වැටුප් ගෙවීම, ජල විදුලි ගාස්තු ගෙවීම, අවශ්‍ය බෙහෙත් තොග සැපයීම යනාදී මූලික පහසුකම් ලබාදීමට අමතරව පහත සඳහන් ක්‍රියාමාර්ග වෙත යොමු විය.

1. 2. (i) සායන සඳහා කාර්යාල සහායකයින් (කම්කරුවන්) බඳවා ගැනීම.

රජයේ හෝමියෝපති සායනවල කටයුතු කිරීම සඳහා වෛද්‍ය නිලධාරි සහ ඖෂධ සංයෝජක යන දෙදෙනා හැරුණු විට වෙනත් කිසිදු සේවකයෙකු නොවීම මෙම සායන පවත්වා ගෙන යාමේදී මුහුණු දුන් බරපතලම ගැටලුවක් විය. මේ නිසා මීට පෙර පැවති හෝමියෝපති අතුරු පාලක කමිටුව විසින් සායන 07 සඳහා කාර්යාල සහායක (කම්කරු) තනතුරු 07ක් අනුමත කර ගෙන තිබූ අතර අතුරු වෛද්‍ය සභාව මෙම පුරප්පාඩු තනතුරු 07 සඳහා බඳවා ගනිමින් වෛද්‍ය සභා කාර්ය මණ්ඩලය සාමාජික සංඛ්‍යාව විසිහය (26) දෙනෙකු දක්වා ඉහළ නැංවීමට කටයුතු කළේය.

1. 2. (ii) සායන සඳහා දුරකතන ලබාදීම.

වඩාත් ඵලදායී සහ කාර්යක්ෂම සේවාවක් ස්ථාපිත කිරීමේ අමුණෙන් සායන 07 වෙත ස්ථාවර දුරකතන සබඳතා ලබාදීමට අතුරු වෛද්‍ය සභාව තීරණය කරන ලදී. අදාළ ඇස්තමේන්තු සකස් කර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කෙරුණු අතර මෙම ඉල්ලීම, අමාත්‍යාංශය විසින් අදාළ ආයතන වෙත වර්ෂ අවසානය වන විට යොමු කර තිබුණි.

1. 2. (iii) සායන වෙත අතිරේක වෛද්‍යවරුන් ලබාදීම සඳහා නිර්ණායකයක් සැකසීම.

රජයේ හෝමියෝපති සායන වෙත දිනපතා පැමිණෙන රෝගීන් සංඛ්‍යාව ඉහළ යාමත් සමග අතිරේක වෛද්‍යවරයෙකු ලබා දෙන ලෙස සායන කිහිපයකින්ම කර තිබූ ඉල්ලීම සලකා බැලීමෙන් පසුව, හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේ පවතින සුවිශේෂීතාව සලකා, දිනකට එක් වෛද්‍යවරයෙකුට පරීක්ෂා කළ හැකි රෝගීන් ප්‍රමාණය පිළිබඳව සම්මතයක් ගොඩ නඟා ගැනීමේ අරමුණින් හෝමියෝපති වෛද්‍යවරුන්ගේ වැඩමුළු දෙකක් පවත්වන ලදී.

02. හෝමියෝපති ජංගම සායන.

2.1. හෝමියෝපති ජංගම සායන පැවැත්වීම.

හෝමියෝපති වෛද්‍ය ප්‍රතිකාර වල වැදගත්කම හඳුනාගෙන ඇති පුද්ගලයින් හා සංවිධාන මගින් රටේ විවිධ ස්ථානවල හෝමියෝපති සම්මන්ත්‍රණ හා ජංගම සායන සංවිධානය කිරීමට මෙම වසරේදී ද වෛද්‍ය සභා කාර්යාලය කටයුතු කළේය. මෙම ජංගම සායනවලට ප්‍රධාන වශයෙන් වෛද්‍යවරුන් සහ කාර්ය මණ්ඩලය සපයනු ලබන්නේ වැලිසර හෝමියෝපති රෝහල මඟිනි.

කොළඹ සහ පුත්තලම යන දිස්ත්‍රික්ක දෙකෙහි හෝමියෝපති සම්මන්ත්‍රණ හා ජංගම සායන 15ක් මෙලෙස පැවැත් වූ අතර රෝගීහු 1702 ක් මේවායින් ප්‍රතිකාර ගෙන තිබුණි.



දෙහිවල රජයේ හෝමියෝපති සායනයේ මෙහෙයවීමෙන් පැවති පාසල් සායනයකින් ගුරුවරියන් පිරිසක් ප්‍රතිකාර සඳහා යොමුව සිටි අයුරු .

දෙහිවල රජයේ හෝමියෝපති සායනයේ මෙහෙයවීමෙන් සම්මන්ත්‍රණ හා ජංගම සායන දෙකක් සහ කුරුණෑගල රජයේ හෝමියෝපති සායනයේ මෙහෙයවීමෙන් එක් සම්මන්ත්‍රණයක් හා සායනයක් වශයෙන් සම්මන්ත්‍රණ හා ජංගම සායන 3ක් ද මෙම සායනවල සම්පූර්ණ දායකත්වය මත පැවැත්වීය. මේ සඳහා රෝගීන් 398 දෙනෙකු සහභාගි විය.

මෙයට අමතරව, සායන සඳහා අවශ්‍ය බෙහෙත් ඇතුළු සියලුම සේවාවන් පෞද්ගලිකව නොමිලේ සපයමින් වෛද්‍ය සභාවේ සභාපතිවරයාගේ මෙහෙයවීමෙන්, හෝමියෝපති වෛද්‍යවරුන් විසින් සම්මන්ත්‍රණ හා ජංගම සායන 5 ක් මරදාන, මීගොඩ, කොටහේන,මීගමුව, හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය යන ස්ථානවල පවත්වන ලදී. මෙම සායන සඳහා සහභාගී වූ රෝගීන් සංඛ්‍යාව 1833 කි.

2.2. හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳ සමාජ දැනුවත්භාවය වර්ධනය කිරීම.

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය තුළින් ඩෙංගු රෝගය වැළඳීම වළක්වා ගැනීමේ හා මර්ධනය කිරීමේ හැකියාව පිළිබඳව වැඩමුළුවක් සහ සායනයක් දෙහිවල ගල්කිස්ස නගර සභා බල ප්‍රදේශයේ දී දෙහිවල සායනයේ කාර්යභාර වෛද්‍ය නිලධාරිනී වෛද්‍ය අනුෂා හේමකුමාර මිය විසින් පවත්වනු ලැබුවාය. මේ සඳහා 380 දෙනෙකු සහභාගි විය.

හෝමියෝපති අතුරු වෛද්‍ය සභාවේ සභාපති විසින් මහනුවර නගරයේ හෝමියෝපති වෛද්‍යවරුන් සමඟ ස්වේච්ඡා පදනමින්, හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේ රෝග නිවාරණ ශක්තිය හා ඖෂධ භාවිතය සම්බන්ධ තේමාවන් 03 ක් යටතේ වැඩ මුළු 03 ක් පවත්වන ලදී. මෙම වැඩ සටහන් සඳහා 380 දෙනෙකු සහභාගී වී තිබුණි.

2.3. ඉලෙක්ට්‍රොනික සහ මුද්‍රිත මාධ්‍ය වැඩසටහන්.

වෛද්‍ය සභාවේ සභාපතිවරයා, සායනවල කාර්යභාර වෛද්‍ය නිලධාරීන් සහ ලියාපදිංචි වෛද්‍යවරුන් රූපවාහිනී වැඩසටහන් 26 කට මෙම වසර තුළ සහභාගි විය. එමෙන්ම ගුවන්විදුලි වැඩසටහන් 13 කදී වෛද්‍යවරුන් හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳ ව ජනතාව දැනුවත් කිරීමට ක්‍රියා කරන ලදී.

මාධ්‍ය මගින් හෝමියෝපති පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්

අනු අංකය	වැඩසටහන	මාධ්‍ය	මෙහෙයවීම
1	පෙනහළු රෝග සුවයට හෝමියෝපති ප්‍රතිකාර	සියත ටී. වී නාලිකාව	දෙහිවල හෝමියෝපති සායනය
2	ආතරයිටිස් රෝගයට හෝමියෝපති ප්‍රතිකාර	සියත ටී. වී නාලිකාව	දෙහිවල හෝමියෝපති සායනය
3	ඔස්ටියෝපෝරෝසිස් රෝගයට හෝමියෝපති ප්‍රතිකාර	සියත ටී. වී නාලිකාව	දෙහිවල හෝමියෝපති සායනය
4	හිරිවැටීම, නහර ගැටගැසීම සුවයට හෝමියෝපති ප්‍රතිකාර	සියත ටී. වී නාලිකාව	දෙහිවල හෝමියෝපති සායනය
5	ගැස්ට්‍රයිටිස් රෝගයට හෝමියෝපති ප්‍රතිකාර	සියත ටී. වී නාලිකාව	දෙහිවල හෝමියෝපති සායනය
6	හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේ මූලික සිද්ධාන්ත	සියත ටී. වී නාලිකාව	දෙහිවල හෝමියෝපති සායනය
7	හෝමියෝපති දැනුවත් කිරීමේ වැඩසටහන්	ස්වාධීන රූපවාහිනී සේවය	දෙහිවල හෝමියෝපති සායනය
8	බෙල්ල කැක්කුම සුවයට හෝමියෝපති ප්‍රතිකාර	සියත ටී. වී නාලිකාව	දෙහිවල හෝමියෝපති සායනය
9	පාකින්සන් සුවයට හෝමියෝපති ප්‍රතිකාර	සියත ටී. වී නාලිකාව	දෙහිවල හෝමියෝපති සායනය.
10	කොන්ද කැක්කුම සඳහා හෝමියෝපති ප්‍රතිකාර	සියත ටී. වී නාලිකාව	දෙහිවල හෝමියෝපති සායනය
11	කොන්ද කැක්කුම සඳහා හෝමියෝපති ප්‍රතිකාර	ITN ගුවන් විදුලිය	දෙහිවල හෝමියෝපති සායනය

12	නහර ගැටගැසීම සුවයට හෝමියෝපති ප්‍රතිකාර	ITN ගුවන් විදුලිය	දෙහිවල හෝමියෝපති සායනය
13	ඩෙංගු රෝගය සුවයට හෝමියෝපති ප්‍රතිකාර	ITN ගුවන් විදුලිය	දෙහිවල හෝමියෝපති සායනය
14	බෙල්ල කැක්කුම සුවයට හෝමියෝපති ප්‍රතිකාර	ITN ගුවන් විදුලිය	දෙහිවල හෝමියෝපති සායනය
15	සෙම් රෝග සුවයට හෝමියෝපති ප්‍රතිකාර	ITN ගුවන් විදුලිය	දෙහිවල හෝමියෝපති සායනය
16	ඇදුම රෝගය සුවයට හෝමියෝපති ප්‍රතිකාර	ITN ගුවන් විදුලිය	දෙහිවල හෝමියෝපති සායනය
17	ඇඟිලි අගුලු වැටීම, සුවයට හෝමියෝපති ප්‍රතිකාර	ITN ගුවන් විදුලිය	දෙහිවල හෝමියෝපති සායනය
18	අත් පාද හිරිය සුවයට හෝමියෝපති ප්‍රතිකාර	ITN ගුවන් විදුලිය	දෙහිවල හෝමියෝපති සායනය
19	වෛරස් උණ රෝගය සුවයට හෝමියෝපති ප්‍රතිකාර	ITN ගුවන් විදුලිය	දෙහිවල හෝමියෝපති සායනය
20	අතුරු ආබාධ නැති හෝමියෝපති ප්‍රතිකාර මඟින් රෝග වලට නිසැක සුවය	ඉරිදා ලක්බිම පුවත්පත	දෙහිවල හෝමියෝපති සායනය
21	ඩෙංගු රෝගීන්ගේ ජීවිත රැක දෙන හෝමියෝපති ප්‍රතිකාර	ඉසිවර පුවත්පත අගෝස්තු කලාපය	දෙහිවල හෝමියෝපති සායනය
22	පාකින්සන් රෝගීන්ට	ඉසිවර පුවත්පත සැප්තැම්බර් කලාපය	දෙහිවල

	පුනර්ජීවනය ලබා දෙන හෝමියෝපති ප්‍රතිකාර		හෝමියෝපති සායනය
23	අත් පාද ඇදය නැති කිරීමට හෝමියෝපති දිවි ඔසුවේ අරුමය.	ඉසිවර පුවත්පත ඔක්තෝබර් කලාපය	දෙහිවල හෝමියෝපති සායනය
24	හෝමියෝපති වෛද්‍ය ප්‍රතිකාර මඟින් නහර ගැට ගැසීම සුව කරයි	ඉසිවර පුවත්පත නොවැම්බර් කලාපය	දෙහිවල හෝමියෝපති සායනය
25	බෙල්ල කැක්කුම සුව කරන හෝමියෝපති ප්‍රතිකාර	ඉසිවර පුවත්පත දෙසැම්බර් කලාපය	දෙහිවල හෝමියෝපති සායනය

මහජනතාව දැනුවත් කිරීමේ මෙම වැඩසටහන් හෝමියෝපති සායන සහ හෝමියෝපති රෝහල කරා අළුත් රෝගීන් ඇදී ඒමට මග පෑදීය.

03. නව හෝමියෝපති පනත බලාත්මක කිරීම.

3.1 නියෝග කෙටුම්පත් කිරීම.

2016 අංක 10 දරණ හෝමියෝපති පනත බලාත්මක කිරීම සඳහා ගරු ඇමතිතුමාගේ උපදෙස් පරිදි සකසනු ලබන නියෝග කෙටුම්පත් කර ඉදිරිපත් කිරීම මෙම වසරේ ප්‍රමුඛ කාර්ය ලෙස අතුරු වෛද්‍ය සභාව සැලකිල්ලට ගෙන තිබුණි. මේ අනුව පහත සඳහන් කෙටුම්පත් අවසාන අදියර දක්වා සකස් කරනු ලැබීය.

i. හෝමියෝපති වෛද්‍ය සභාව පත් කර ගැනීම සඳහා වන නියෝග.
ii. හෝමියෝපති වෛද්‍යවරුන්, පරිපූරක වෛද්‍ය වෘත්තිකයන් ප්‍රතිකාර මධ්‍යස්ථාන සහ විවිධ සේවාවන් සපයන හෝමියෝපති ආයතන ලියාපදිංචිය සහ ඒවායෙහි ලියාපදිංචිය යාවත්කාලීන කිරීම සඳහා වන නියෝග.

3.2 රීති කෙටුම්පත් කිරීම.

මෙම පනතේ 30 වගන්තිය ප්‍රකාරව වෛද්‍යවරුන් ලියාපදිංචිය සඳහා සම්මත කළ යුතු නීති සෑදීමේ බලය වෛද්‍ය සභාව සතු වේ. මේ අනුව අදාළ විභාග පැවැත්විය යුතු රීති සම්පාදනය වසර අවසාන වන විට සම්පූර්ණ කරන ලදී.

04. හෝමියෝපති වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම.

4.1 හෝමියෝපති උපාධිධාරී වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම.

ඉන්දියාවේදී හෝමියෝපති වෛද්‍ය විද්‍යාව හැදෑරූ හෝමියෝපති උපාධිධාරී වෛද්‍යවරුන් 4 දෙනෙකු හෝමියෝපති වෛද්‍ය සභාවේ සාමාන්‍ය ලේඛනයේ ලියාපදිංචි කරන ලදී. මේ අනුව එතෙක් මෙතෙක් ලියාපදිංචි කර ඇති හෝමියෝපති වෛද්‍යවරුන් සංඛ්‍යාව 281 ක් වේ.

4.2 පනතේ 30 (1) වගන්තිය ප්‍රකාරව හෝමියෝපති වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම.

2016 අංක 10 දරණ හෝමියෝපති පනතේ 30 (1) වගන්තිය අනුව වසර 5 කට වඩා හෝමියෝපති වෛද්‍ය කර්මයේ යෙදුණු අය විභාගයක් පවත්වා හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් ලෙස ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් කැඳවන ලදී. මේ සඳහා අයදුම්පත් 185 ක් ලැබී තිබුණි.

මෙම විභාගය පැවැත්වීම සඳහා අවශ්‍ය රීති කෙටුම්පත් කිරීම අතුරු වෛද්‍ය සභාව විසින් සිදු කරනු ලැබූ අතර එය 2017 වර්ෂ අවසාන වන විට අවසන් විය. රීති ගැසට් කිරීමෙන් පසු ඉදිරි කටයුතු ආරම්භ කෙරෙනු ඇත.

05. කාර්ය මණ්ඩලය සඳහා නව තනතුරු අනුමත කර ගැනීම.

වෛද්‍ය සභා කාර්යාලයේ සේවයේ නියුතු කළමනාකරණ සහකාරිනියන් දෙදෙනාට ඉටු කිරීමට නොහැකි තරම් කාර්යයන් විශාල ප්‍රමාණයක් වෛද්‍ය සභා කාර්යාලයට දිනපතා පැවරෙමින් තිබීමත්, නව හෝමියෝපති පනතින් වෛද්‍ය සභාවේ මුලා හා ගිණුම් කටයුතු සම්පූර්ණයෙන්ම සහ නව කාර්යයන් විශාල ප්‍රමාණයක් වෛද්‍ය සභාව වෙත පවරා තිබීමත් සැලකිල්ලට ගත් අතුරු වෛද්‍ය සභාව, ගණකාධිකාරී ඇතුළු නව තනතුරු 07 ක් අනුමත කරවා ගැනීමට තීරණය කර එම ඉල්ලීම අමාත්‍යාංශය මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

06. වෛද්‍ය සභා කාර්යාලය අලුත්වැඩියා කර පහසුකම් සැපයීම.

හෝමියෝපති වෛද්‍ය සභා කාර්යාල ගොඩනැඟිල්ල වෛද්‍ය සභාවේ සභාපතිවරයාගේ කාර්යාලය ද පවත්වාගෙන යා හැකි පරිදි අලුත්වැඩියා කිරීමටත්, පාසල් ගොඩනැඟිල්ලෙහි පුස්තකාලය, දේශන ශාලාව, ඖෂධ ගබඩාව, ගබඩා කාමරය පවත්වාගෙන යා හැකි පරිදි එම ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමටත් තීරණය කරන ලදී. මුලදී මේ සඳහා රු. 1,355,614.34 ක් වෙන් කර ඉදිකිරීම් කටයුතු වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැවරීය. වර්ෂ අවසානය වනවිට මෙහි කටයුතු වලින් අඩක් පමණ නිම කිරීමට හැකි විය.

එමෙන්ම, කාර්යාලය සඳහා අවශ්‍ය ලී භාණ්ඩ වලින් සැලකිය යුතු ප්‍රමාණයක් මිලදී ගැනීමට ද ක්‍රියා කරනු ලැබීය.

07. හෝමියෝපති ඖෂධ ආනයනය සඳහා බලපත්‍ර අනුමත කිරීම.

හෝමියෝපති ඖෂධ ආනයනය සඳහා ඉදිරිපත් කෙරුණු ඉල්ලුම්පත් 7කට අනුමැතිය ලබාදීමට අතුරු වෛද්‍ය සභාව කටයුතු කර ඇත. ඒවායෙහි මුළු වටිනාකම ඇ.ඩො. 28,790.77 කි.

11. වාර්ෂික ගිණුම් වාර්තා

2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අවසාන ගිණුම්

අන්තර්ගතය

- **2017.12.31** දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට පාදක **(1** සිට **6** දක්වා**)** සටහන්
- **2017.12.31** දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය
- මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට පාදක **(1** සිට **9** දක්වා**)** සටහන්
- **2017.12.31** දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
- ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට පාදක **(1** සිට **6** දක්වා**)** සටහන්
- **2017.12.31** දිනට ශේෂ පිරික්සුම
- **2017.12.31** දිනට ස්ථාවර වත්කම් ක්ෂය ලේඛණය
- **2017.12.31** දිනට ස්කන්ධය වෙනස්වීම් වාර්තාව

ගිණුම්කරණ ප්‍රතිපත්ති

ගිණුම් ඉදිරිපත් කිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (2009) අංක -1 ට අනුවය. එසේම එහි "ස්වභාවය මත වියදම් වර්ගීකරණය විදහා පෑම " යන පරිදි ඉදිරිපත් කර ඇත.

අතුරු වෛද්‍ය සභාව විසින් ගනු ලැබූ තීරණයන්ට අනුව, ලංකා බැංකු ගිණුමෙන් හෝමියෝපති වෛද්‍ය සභාව විසින් දරා ඇති සියළුම වියදම් සහ පුනරාවර්තන ප්‍රතිපාදනයත්, ප්‍රාග්ධන ප්‍රතිපාදනයත් සැලකිල්ලට ගෙන අවසන් ගිණුම් පිළියෙල කර ඇත.

ක්ෂය සඳහා වෙන් කිරීම

සෑම ස්ථාවර වත්කමක්ම ක්ෂය කර ඇත්තේ හීනවන ශේෂ ක්‍රමය පදනම් කරගෙන වේ.

2017.12.31 දින දක්වා සෑම වත්කමක්ම ක්ෂය කර ඇත්තේ 12%ක ක්ෂය අනුපාතයට වේ.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 (28) (b) පරිදි වත්කම්හි පිරිවැය ගිණුම් ගත කර ඇත.

2016.12.31 දින දක්වා වත්කම්, වර්ෂයේ කුමන දිනයක මිලදී ගත්තද, එය සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කරනු ලැබ ඇත.

2017 වර්ෂයේ දෙසැම්බර් මාසයේ අවසානයේ මිළදී ගත් වත්කම් වර්ෂය තුල භාවිතයට නොගත් බැවින්, එම වර්ෂය සඳහා ක්ෂය කර නැත. වත්කම්, වර්ෂයේ කුමන දිනයක ඉවත් කලද, අදාල සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කරනු නොලැබේ.

පාරිතෝෂික සඳහා වෙන් කිරීම

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත අනුව වර්ෂ පහකට වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන්, පාරිතෝෂික ගෙවීම සඳහා සුදුසුකම් ලබන බැවින්, පණතේ සඳහන් පරිදි වසර පහකට වඩා වැඩි සේවා කාලයක් ඇති නිළධාරීන් සඳහා පමණක් පාරිතෝෂික සඳහා වෙන් කර ඇති අතර, වසර පහක සේවා කාලය සම්පූර්ණ කරනු ලැබූපසු මුළු සේවා කාලයටම පාරිතෝෂික ගෙවිය යුතු වන බැවින්, මෙතෙක් වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය ශේෂයක් ලෙස තවදුරටත් දක්වා ඇත.

හෝමියෝපති වෛද්‍ය සභාව

2017.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය

	සටහන	2017	2016
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන දෑ	1	2,274,507	2,334,346
ජංගම නොවන වත්කම්			
පිරියන හා උපකරණ	2	1,715,119	1,003,317
ගොඩනැගිලි පුනරුත්ථාපන		4,227,506	2,812,738
වෙනත් උපකරණ		1,450	1,450
		5,944,075	**3,817,505**
මුළු වත්කම්		**8,218,582**	**6,151,851**
බැරකම්			
ජංගම බැරකම්			
ගෙවිය යුතු දෑ	3	844,316	594,126
ජංගම නොවන බැරකම්			
මුළු බැරකම්		844,316	594,126
ශුද්ධ වත්කම්		7,374,266	5,557,725
		8,218,582	**6,151,851**
ශුද්ධ වත්කම්/ ස්කන්ධය			
ප්‍රාග්ධනය		2,562,144	2,562,144
රජයේ ප්‍රාග්ධන ප්‍රතිපාදනය		5,677,925	3,430,957
සමුච්චිත ඌනතා./අතිරික්තය		(893,263)	(462,836)
පෙර වර්ෂයේ ගැලපුම් ගිණුම		27,460	27,460
ශුද්ධ වත්කම්/ ස්කන්ධය		**7,374,266**	**5,557,725**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව විසින් දරණ බව සහතික කරමු.

ලේඛකාධිකාරී	සභාපති	කමිටු සාමාජික
හෝමියෝපති	හෝමියෝපති	හෝමියෝපති
වෛද්‍ය සභාව	වෛද්‍ය සභාව	
එම්. ඒ. පෙරේරා		ඩබ්. ඒ. සී. එස්. ප්‍රියදර්ශනී
ලේඛකාධිකාරී	සභාපති	ප්‍රධාන ගණකාධිකාරී
හෝමියෝපති වෛද්‍ය සභාව	හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව	දේශීය වෛද්‍ය අංශය

ඩී. ඒ. විමලවර්ධන යහාට
අධ්‍යක්ෂ (අරමුදල් මෙහෙයුම්පාලනය හා දේශීය වෛද්‍ය අභ්‍යාසාංශය)
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය

දේශීය වෛද්‍ය අංශය
අංක 464, ඒ. ඒ. ජයා මාවත, කොළඹ 10.

සටහන 1.	2017	2016
මුදල් හා මුදල් සමාන දෑ		
කොමර්ෂල් බැංකුව	1,702,684	-
ලංකා බැංකුව	375,923	-
ලංකා බැංකුව රාජගිරිය	195,900	-
	2,274,507	**-**
සටහන 2.		
පිරියත හා උපකරණ		
පිරියත හා උපකරණ (ගත්මිල)	3,155,516	2,323,316
අඩුකළා:		
සමුච්චිත ක්ෂය	1,440,397	1,319,999
ශුද්ධ අගය	**1,715,119**	**1,003,317**
සටහන 3.		
ගෙවිය යුතු දෑ		
ගෙවිය යුතු විගණන ගාස්තු	143,861	185,616
ගෙවිය යුතු දුරකතන ගාස්තු	5,643	647
ගෙවිය යුතු බෙහෙත් ශාලා ගාස්තු		28,450
ගෙවිය යුතු විදුලිය	4,296	1,737
ගෙවිය යුතු ජල ගාස්තු	9,698	792
ගෙවිය යුතු කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා	98,860	
ගෙවිය යුතු අර්ථසාධක අරමුදල්	7,475	
ගෙවිය යුතු සේවා නියුක්ති භාර අරමුදල්	1,869	
ගෙවිය යුතු වෛද්‍ය සහා සභාපති දීමනා ගාස්තු	75,000	
ගෙවිය යුතු පාරිතෝෂික	497,614	376,884
	844,316	**594,126**

සටහන 4

ගිණුම් ඉදිරිපත් කිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (2009)
අංක -1 ට අනුවය.

සටහන 5

ක්ෂය සඳහා වෙන් කිරීම

සෑම ස්ථාවර වත්කමක්ම ක්ෂය කර ඇත්තේ හීනවන ශේෂ ක්‍රමය පදනම් කරගෙන වේ.

2017.12.31 දින දක්වා සෑම වත්කමක්ම ක්ෂය කර ඇත්තේ 12%ක ක්ෂය අනුපාතයට වේ.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 (28) (b) පරිදි වත්කම්හි පිරිවැය ගිණුම් ගත කර ඇත.

2016.12.31 දින දක්වා වත්කම්, වර්ෂයේ කුමන දිනයක මිලදී ගත්තද, එය

සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කරනු ලැබ ඇත.
2017 වර්ෂයේ දෙසැම්බර් මාසයේ අවසානයේ මිළදී ගත් වත්කම් වර්ෂය තුල භාවිතයට නොගත් බැවින්, එම වර්ෂය සඳහා ක්ෂය කර නැත. වත්කම්, වර්ෂයේ කුමන දිනයක ඉවත් කලද, අදාල සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කරනු නොලැබේ.

සටහන 6
පාරිතෝෂික සඳහා වෙන් කිරීම

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත අනුව වර්ෂ පහකට වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන්, පාරිතෝෂික ගෙවීම සඳහා සුදුසුකම් ලබන බැවින්, පණතේ සඳහන් පරිදි වසර පහකට වඩා වැඩි සේවා කාලයක් ඇති නිළධාරීන් සඳහා පමණක් පාරිතෝෂික සඳහා වෙන් කර ඇති අතර, වසර පහක සේවා කාලය සම්පූර්ණ කරනු ලැබූපසු මුළු සේවා කාලයටම පාරිතෝෂික ගෙවිය යුතු වන බැවින්, මෙතෙක් වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය ශේෂයක් ලෙස තවදුරටත් දක්වා ඇත.

හෝමියෝපති වෛද්‍ය සභාව

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

	සටහන	2017	2016
අයභාරය			
රජයේ පුනරාවර්තන ප්‍රතිපාදන		13,786,709	12,596,733
වෙනත් අයභාර	1	51,000	43,100
බැංකු පොලී		83,047	79,534
මුළු අයභාරය		**13,920,756**	**12,719,367**
වියදම්			
වැටුප් චේතන හා සේවක ප්‍රතිලාභ	2	11,972,353	10,301,697
සැපයුම් හා පාරිභෝජන ද්‍රව්‍ය	3	69,990	18,845
ක්ෂය හා ක්‍රම ක්ෂය		120,398	136,816
වෙනත් වියදම්	4	2,181,798	2,678,161
මූල්‍ය පිරිවැය (බැංකු ගාස්තු)		6,644	6,363
මුළු වියදම්		**14,351,183**	**13,141,882**
කාලච්ඡේදය සඳහා ඌනතාවය /අතිරික්තය		**(430,427)**	**(422,515)**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව විසින් දරණ බව සහතික කරමු.

ලේඛකාධිකාරී	සභාපති	සාමාජික	සකස් කළේ.
හෝමියෝපති	හෝමියෝපති	හෝමියෝපති	ප්‍රධාන ගණකාධිකාරී
වෛද්‍ය සභාව	වෛද්‍ය සභාව	වෛද්‍ය සභාව	දේශීය වෛද්‍ය අංශය

එම්. ඒ. පෙරේරා
ලේඛකාධිකාරී
හෝමියෝපති වෛද්‍ය සභාව
අංක. 94, වැලිසර,
රාගම.

සභාපති
හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව

ඒ. සී. විමලසේන
අධ්‍යක්ෂ (අරමුදල් මෙහෙයුම් හා ගිණුම්)
ාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
ය නාෂ්ඩාගාරය
ාවත්ත 01.

ඩබ්. ඒ. සී. එස්. ප්‍රියදර්ශනී
ප්‍රධාන ගණකාධිකාරී
ාධ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ
දේශීය වෛද්‍ය අංශය
ාවත්ත 464, ඒ. බී. රයා මාවත, කොළඹ 10

සටහන 1	2017	2016
වෙනත් අයභාර		
වාර්ෂික ගාස්තු	4,050.00	5,100.00
විවිධ ලැබීම්	46,950.00	38,000.00
	51,000.00	**43,100.00**
සටහන 2		
වැටුප් වේතන හා සේවක ප්‍රතිලාභ		
කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා	10,424,323	8,961,708
සේවක අර්ථ සාධක අරමුදල්	1,238,424	1,071,991
සේවා නියුක්ති භාර අරමුදල්	309,606	267,998
	11,972,353	**10,301,697**
සටහන 3		
සැපයුම් හා පාරිභෝජන ද්‍රව්‍ය		
ලිපිද්‍රව්‍ය වියදම්	12,896	6,002
සංග්‍රහ වියදම්	57,094	12,843
	69,990	**18,845**
සටහන 4		
වෙනත් වියදම්		
විගණන ගාස්තු	20,000	40,000
දුරකථන ගාස්තු	80,635	47,358
වෛද්‍ය සායන සඳහා වියදම්	220,240	333,450
විදුලිය ගාස්තු	55,686	21,290
ජල ගාස්තු	64,170	52,397
ගමන් වියදම් හා නවාතැන් වියදම්	1,570	6,070
ඉන්ධන වියදම්	13,500	
තැපැල් ගාස්තු	5,815	
මුද්‍රණ ගාස්තු	82,690	275,829
වෛද්‍ය සහාව සඳහා විවිධ වියදම්	27,523	21,679
භාෂා පරිවර්තන ගාස්තු	25,740	17,587
හැඳුනුම්පත් සැකසීමේ වියදම්	12,420	
සභාපති දීමනා	1,050,000	
අතුරු වෛද්‍ය සහා රැස්වීම් දීමනා	258,000	168,000
පුවත්පත් දැන්වීම් ගාස්තු	106,318	
සුළු අළුත්වැඩියා වියදම්	36,761	
පාරිතෝෂික වියදම්	120,730	376,884
වෛද්‍ය සායන සඳහා වූ විවිධ වියදම්		17,130
කාර්යාල උපකරණ අළුත්වැඩියා		10,047.00
වෛද්‍ය සායන සඳහා උපකරණ(කුප්පි /කවර)		1,290,440
	2,181,798	**2,678,161**

සටහන 5

ගිණුම් ඉදිරිපත් කිරීම
ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (2009)
අංක -1 ට අනුවය. එසේම එහි “ස්වභාවය මත වියදම් වර්ගීකරණය විදහා පෑම " යන පරිදි ඉදිරිපත් කර ඇත.

සටහන 6

2017 වර්ෂය තුල ගෙවන ලද විගණන ගාස්තු 2014/2015 වර්ෂයන් සඳහා අදාල බැවින් විගණන ගාස්තු සඳහා වෙන් කිරීමේ ගිණුමට ගලපා ඇති අතර, 2017 වර්ෂය සඳහා විගණන ගාස්තු වෙන්කර ඇත.

සටහන 7

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත අනුව වර්ෂ පහකට වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන්, පාරිතෝෂික ගෙවීම සඳහා සුදුසුකම් ලබන බැවින්, පණතේ සඳහන් පරිදි වසර පහකට වඩා වැඩි සේවා කාලයක් ඇති නිළධාරීන් සඳහා පමණක් පාරිතෝෂික සඳහා වෙන් කර ඇති අතර වර්ෂයට අදාල වටිනාකම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි දක්වා ඇත.

සටහන 8

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 (28)(b) අනුව, පිරියත හා උපකරණ ගෙන ඒම සඳහා දරණ ලද ප්‍රවාහන පිරිවැය ප්‍රාග්ධනිත කර ඇත.

සටහන 9

අතුරු වෛද්‍ය සභාව විසින් ගනු ලැබූ තීරණයන්ට අනුව, ලංකා බැංකු ගිණුමෙන් හෝමියෝපති වෛද්‍ය සභාව විසින් දරා ඇති සියළුම වියදම් සහ පුනරාවර්තන ප්‍රතිපාදනයන්, ප්‍රාග්ධන ප්‍රතිපාදනයන් සැලකිල්ලට ගෙන අවසන් ගිණුම් පිළියෙල කර ඇත.

හෝමියෝපති වෛද්‍ය සභාව

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	සටහන	2017	2016
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන්			
ලැබීම්			
රජයෙන් ලද පුනරාවර්තන ප්‍රදානය		13,786,709	12,663,330
බැංකු පොලී		83,047	79,534
වෙනත් ලැබීම්	1	51,000	43,100
		13,920,756	**12,785,964**
ගෙවීම්			
සේවක පිරිවැය	2	11,864,149	10,277,013
බැංකු පොලී (බැංකු ගාස්තු)		6,644	6,363
වෙනත් ගෙවීම්	3	2,109,802	2,386,317
		13,980,595	**12,669,693**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**(59,839)**	**116,271**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන්			
රජයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදානය		2,246,968	1,858,910
ගොඩනැගිලි පුනරුත්ථාපන		1,414,768	1,858,910
දේපල පිරියත හා උපකරණ		832,200	
ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය			
මුදල් හා මුදල් හා සමාන දෑ හි ශුද්ධ වැඩිවීම	4	(59,839)	116,271
කාලපරිච්ඡේදය ආරම්භයේදීවූ මුදල් හා මුදල් හා සමාන දෑ.	5	2,334,346	2,218,075
කාලපරිච්ඡේදය අවසානයේදීවූ මුදල් හා මුදල් හා සමාන දෑ	6	2,274,507	2,334,346

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව විසින් දරණ බව සහතික කරමු.

.....	.....	.....	.....
ලේඛකාධිකාරී	සභාපති	කමිටු සාමාජික	සකස් කළේ,
හෝමියෝපති	හෝමියෝපති	හෝමියෝපති	සුධාන ගුණකාධිකාරී
වෛද්‍ය සභාව	වෛද්‍ය සභාව	වෛද්‍ය සභාව	දේශීය වෛද්‍ය ආංශය

ජී. ඩී. පෙරේරා
ලේඛකාධිකාරී
හෝමියෝපති වෛද්‍ය සභාව
අංක. 94. වැඹිපර.

සභාපති
හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව

ජී. පී. විමලසේන
අධ්‍යක්ෂ (වෛද්‍ය සභාව)
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
කොළඹ 01.

බී.ඒ. ඒ. එස්. ප්‍රසාදිරත්නී
දේශීය වෛද්‍ය ආංශය
අංක 464, පී. බී. ජයා මාවත, කොළඹ

	2017	2016
සටහන 1 - අනෙකුත් ලැබීම්		
වාර්ෂික ගාස්තු	4,050	5,100
විවිධ ආදායම්	46,950	38,000
	51,000	**43,100**
සටහන 2 - සේවක පිරිවැය		
කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා	10,325,463	8,937,024
සේවක අර්ථ සාධක අරමුදල්	1,230,949	1,071,991
සේවා නියුක්ති භාර අරමුදල්	307,737	267,998
	11,864,149	**10,277,013**
සටහන 3 - අනෙකුත් ගෙවීම්		
විගණන ගාස්තු	61,755	66,597
දුරකථන ගාස්තු	75,639	52,675
වෛද්‍ය සායන සඳහා වූ විවිධ වියදම්	242,567	342,450
විදුලිය ගාස්තු	53,127	20,269
ජල ගාස්තු	55,264	53,405
ගමන් වියදම්	1,570	7,637
ඉන්ධන වියදම්	13,500	
තැපැල් ගාස්තු	5,815	
මුද්‍රණ ගාස්තු	82,690	275,829
වෛද්‍ය සහාව සඳහා වූ විවිධ වියදම්	33,646	
ලිපිද්‍රව්‍ය	12,896	6,902
සංග්‍රහ වියදම්	57,094	12,843
භාෂා පරිවර්තන ගාස්තු	25,740	32,074
හැඳුණුම්පත සැකසීමේ වියදම්	12,420	
සභාපති දීමනා	975,000	
අතුරු වෛද්‍ය සභා නිළධාරී දීමනා	258,000	168,000
දැන්වීම් ගාස්තු	106,318	
සුළු කාර්යාල අළුත්වැඩියා	36,761	
විවිධ වියදම්		21,679
කාර්යාල උපකරණ අළුත්වැඩියා		10,047
වෛද්‍ය සායන සඳහා උපකරණ		1,315,910
	2,109,802	**2,386,317**

	2017	2016
සටහන 4 - මුදල් හා මුදල් හා සමාන දෑ හි ශුද්ධ වැඩිවීම		
වර්ෂය අවසාන මුදල් ශේෂය	2,274,507	2,334,346
වර්ෂය ආරම්භක මුදල් ශේෂය	2,334,346	2,218,075
	(59,839)	**116,271**
සටහන 5 - කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් හා මුදල් හා සමාන දෑ		
කොමර්ෂල් බැංකුව	1,626,281	1,553,110
ලංකා බැංකුව	512,165	469,065
ලංකා බැංකුව රාජගිරිය	195,900	195,900
	2,334,346	**2,218,075**
සටහන 6 - කාලපරිච්ඡේදය අවසානයේ මුදල් හා මුදල් හා සමාන දෑ		
කොමර්ෂල් බැංකුව	1,702,684	1,626,281
ලංකා බැංකුව	375,923	512,165
ලංකා බැංකුව රාජගිරිය	195,900	195,900
	2,274,507	**2,334,346**
	(59,839)	**116,271**
සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ අතිරික්ත/ (ඌනතාවය) මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය සමඟ සැසඳීම		
සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ අතිරික්ත/ (ඌනතාවය)	(430,427)	(422,515)
මුදල් නොවන වෙනස් වීම්		
ක්ෂය වීම්	120,398	136,816
ගෙවිය යුතු වැය වැඩිවීම/අඩුවීම	250,190	401,970
පෙර වර්ෂ ගැලපුම් ගිණුමේ වාර්ෂික වෙනස් වීම්		
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**(59,839)**	**116,271**

හෝමියෝපති වෛද්‍ය සභාව

2017.12.31 දිනට ශේෂ පිරික්සුම

විස්තරය	හර රු.	බැර රු.
රජයේ ප්‍රතිපාදනය - පුනරාවර්තන		13,786,709
විගණන ගාස්තු		
විගණන ගාස්තු	20,000	
විගණන ගාස්තු සඳහා වෙන් කිරීම		143,861
දුරකතන ගාස්තු	80,635	
උපචිත දුරකතන ගාස්තු		5,643
සායන සඳහා දරණ ලද වියදම්	214,117	
විදුලි ගාස්තු	55,686	
උපචිත විදුලි ගාස්තු		4,296
ජල ගාස්තු	64,170	
උපචිත ජල ගාස්තු		9,698
කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා	10,424,323	
උපචිත කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා		98,860
සේවක අර්ථ සාධක අරමුදල	1,238,424	
උපචිත සේවක අර්ථ සාධක අරමුදල		7,475
සේවා නියුක්තයින්ගේ භාරකාර අරමුදල	309,606	
උපචිත සේවා නියුක්තයින්ගේ භාරකාර අරමුදල		1,869
ගමන් වියදම් හා නවාතැන් වියදම්	1,570	
ඉන්ධන වියදම්	13,500	
තැපැල් ගාස්තු	5,815	
මුද්‍රණ ගාස්තු	82,690	
සායන සඳහා සහ වෛද්‍ය සභාව සඳහා වූ විවිධ වැය	33,646	
ලිපිද්‍රව්‍ය වියදම්	12,896	
සංග්‍රහ වියදම්	57,094	
භාෂා පරිවර්තන වියදම්	25,740	
භැඳුණුම්පත් පිළියෙල කිරීමේ වියදම්	12,420	

වෛද්‍ය සභාවේ සභාපති දීමනා	1,050,000	
උපචිත වෛද්‍ය සභාවේ සභාපති දීමනා		75,000
අතුරු වෛද්‍ය සභා නිළධාරී දීමනා	258,000	
පුවත්පත් දැන්වීම් ගාස්තු	106,318	
සුළු කාර්යාල අළුත්වැඩියා වියදම්	36,761	
ප්‍රවාහන වියදම්		
වාර්ෂික ක්ෂය	120,398	
ක්ෂය සඳහා වෙන් කිරීම		1,440,397
පාරිතෝෂික වියදම්	120,730	
පාරිතෝෂික සඳහා වෙන් කිරීම		497,614
රජයේ ප්‍රතිපාදනය - ප්‍රාග්ධන		5,677,925
දේපල, පිරියත හා උපකරණ	3,155,516	
ගොඩනැගිලි පුනරුත්තාපන	4,227,506	
කාර්යාල උපකරණ	1,450	
ප්‍රාග්ධනය		2,562,144
බැංකු ශේෂය - ලංකා බැංකුව	375,923	
බැංකු ශේෂය - කොමර්ෂල් බැංකුව	1,702,684	
බැංකු ශේෂය - ලංකා බැංකුව, රාජගිරිය	195,900	
බැංකු ගාස්තු	6,644	
බැංකු පොලී ආදායම		83,047
වාර්ෂික ගාස්තු ඇතුළු විවිධ ආදායම්		51,000
පෙර වර්ෂ ගැලපුම් ගිණුම		27,460
2016.12.31 දිනට සමුච්චිත ඌනතා ගිණුමේ ශේෂය	462,836	
එකතුව	**24,472,998**	**24,472,998**

හෝමියෝපති වෛද්‍ය සභාව

2017 වර්ෂයේ ස්ථාවර වත්කම් ක්ෂය කිරීමේ ලේඛණය (2017.12.31 දින දක්වා)

අනු අංකය	භාණ්ඩයේ නම	මිලදී ගැනීම් දිනය	ප්‍රමාණය	වටිනාකම	2011.12.31 දින		2012 වර්ෂය		1 වන ලෙසත් දිර්ඝය කළා	2014.01.01 දිනට වටිනාකම	2014.12.31 වන වෙසත් වර්ෂය සඳහා ක්ෂය	2015.01.01 දිනට වටිනාකම	2015.12.31 වන වෙසත් වර්ෂය සඳහා ක්ෂය	2016.01.01 දිනට වටිනාකම	2016.12.31 වන වෙසත් වර්ෂය සඳහා ක්ෂය	2017.01.01 දිනට වටිනාකම	2017.12.31 වන වෙසත් වර්ෂය සඳහා ක්ෂය	2018.01.01 දිනට වටිනාකම
	(ක්ෂය අනුපාතය 12%)				ක්ෂය	වටිනාකම	ක්ෂය	වටිනාකම										
1	2008 වර්ෂයට පෙර			280,492	140,452	140,040	16,805	123,236	14,788	108,447	13,013.64	95,433.34	11,452.00	83,981.34	10,077.76	73,903.58	8,868.43	65,035
2	නාම පුවරුව - වාහනේ	4/28/2008	1	20,125	8,056	12,069	1,448	10,621	1,274	9,346	1,121.55	8,224.69	986.96	7,237.72	868.53	6,369.20	764.30	5,605
3	ඉන්ටර්නෝ මොඩම්	6/26/2008	1	3,910	1,565	2,345	281	2,064	248	1,816	217.92	1,598.05	191.77	1,406.29	168.75	1,237.53	148.50	1,089
4	දුරකථන	7/1/2008	7	34,300	13,730	20,570	2,468	18,102	2,172	15,929	1,911.53	14,017.88	1,682.15	12,335.73	1,480.29	10,855.45	1,302.65	9,553
5	කර්ටන් පොලු	10/6/2008		8,400	3,363	5,037	604	4,433	532	3,901	468.08	3,432.57	411.91	3,020.67	362.48	2,658.19	318.98	2,339
6	Amplifier 100 watts	6/25/2009	5	99,000	31,534	67,466	8,096	59,370	7,124	52,246	6,269.48	45,976.19	5,517.14	40,459.05	4,855.09	35,603.96	4,272.48	31,331
7	Column Speakers	6/25/2009	10	33,000	10,512	22,488	2,699	19,789	2,375	17,415	2,089.76	15,324.94	1,838.99	13,485.95	1,618.31	11,867.64	1,424.12	10,444
8	F.M.Wireless Microphone	6/25/2009	5	66,000	21,023	44,977	5,397	39,580	4,750	34,830	4,179.62	30,650.57	3,678.07	26,972.50	3,236.70	23,735.80	2,848.30	20,888
9	White Board	6/28/2009	5	26,000	8,282	17,718	2,126	15,592	1,871	13,721	1,646.50	12,074.32	1,448.92	10,625.40	1,275.05	9,350.35	1,122.04	8,228

10	OHP Projector	6/29/2009	1	13,384	4,263	9,121	1,095	8,026	963	7,063	847.60	6,215.71	745.88	5,469.82	656.38	4,813.44	577.61	4,236
11	Table Squear - waud	7/7/2009	3	6,060	1,930	4,130	496	3,634	436	3,198	383.79	2,814.48	337.74	2,476.74	297.21	2,179.53	261.54	1,918
12	Plastic Dust Bing	7/7/2009	2	4,000	1,274	2,726	327	2,399	288	2,111	253.32	1,857.69	222.92	1,634.77	196.17	1,438.60	172.63	1,266
13	Gestetor Copy Printer	7/7/2009	1	196,000	62,432	133,568	16,028	117,540	14,105	103,435	12,412.21	91,022.85	10,922.74	80,100.11	9,612.01	70,488.10	8,458.57	62,030
14	Dupliator Cabinet	7/7/2009	1	8,400	2,676	5,724	687	5,037	604	4,433	531.92	3,900.75	468.09	3,432.66	411.92	3,020.74	362.49	2,658
15	ලිපිගොනු කැබිනට් - ලාච්චු 4	7/10/2009	5	60,230	19,185	41,045	4,925	36,120	4,334	31,785	3,814.23	27,971.02	3,356.52	24,614.50	2,953.74	21,660.76	2,599.29	19,061
16	වානේ අල්මාරි	7/10/2009	3	33,516	10,676	22,840	2,741	20,099	2,412	17,687	2,122.48	15,564.82	1,867.78	13,697.04	1,643.65	12,053.40	1,446.41	10,607
17	තේක්ක ජනෙල් හා දොර	7/10/2009	1	32,300	10,289	22,011	2,641	19,370	2,324	17,045	2,045.44	14,999.88	1,799.99	13,199.89	1,583.99	11,615.91	1,393.91	10,222
18	කාර්යාල මේස	7/10/2009	2	16,000	5,097	10,903	1,308	9,595	1,151	8,443	1,013.19	7,430.09	891.61	6,538.48	784.62	5,753.86	690.46	5,063
19	Projector Optoma Movie	10/13/2009	2	180,000	57,335	122,665	14,720	107,945	12,953	94,992	11,399.01	83,592.76	10,031.13	73,561.63	8,827.40	64,734.24	7,768.11	56,966
20	Projector Scren vega	10/13/2009	2	36,960	11,773	25,187	3,022	22,165	2,660	19,505	2,340.58	17,164.24	2,059.71	15,104.53	1,812.54	13,291.98	1,595.04	11,697
21	ඇටමිනිය මී ඉනිමග	10/17/2009	1	6,250	1,991	4,259	511	3,748	450	3,298	395.78	2,902.39	348.29	2,554.10	306.49	2,247.61	269.71	1,978

22	ගැස් කුකර්	10/17/2009	1	3,105	989	2,116	254	1,862	223	1,639	196.64	1,441.99	173.04	1,268.96	152.27	1,116.68	134.00	983
23	ප්ලාස්ටික් වතුර ටැංකි	10/17/2009	1	4,600	1,465	3,135	376	2,759	331	2,428	291.33	2,136.41	256.37	1,880.04	225.61	1,654.44	198.53	1,456
24	ප්ලාස්ටික් වතුර ටැංකි	5/19/2009	1	12,175	3,878	8,297	996	7,301	876	6,425	771.02	5,654.17	678.50	4,975.67	597.08	4,378.59	525.43	3,853
25	ප්ලාස්ටික් පුටු	5/12/2009	6	6,360	2,026	4,334	520	3,814	458	3,356	402.75	2,953.50	354.42	2,599.08	311.89	2,287.19	274.46	2,013
26	ප්ලාස්ටික් රවුම් මේස	5/12/2009	2	4,500	1,433	3,067	368	2,699	324	2,375	285.01	2,090.07	250.81	1,839.27	220.71	1,618.55	194.23	1,424
27	වතුර ටැංකි ප්‍රේම්	10/17/2009	1	7,000	2,230	4,770	572	4,198	504	3,694	443.27	3,250.62	390.07	2,860.55	343.27	2,517.28	302.07	2,215
28	වතුර ටැංකි ප්‍රේම්	5/19/2009	1	5,815	1,852	3,963	476	3,487	418	3,069	368.27	2,700.67	324.08	2,376.59	285.19	2,091.40	250.97	1,840
29	අත්‌ෑදි ලී පුටු	7/21/2009	200	480,000	152,893	327,107	39,253	287,854	34,542	253,312	30,397.40	222,914.26	26,749.71	196,164.55	23,539.75	172,624.80	20,714.98	151,910
30	ඇට සැකිලි ආකෘතිය	4/29/2009	1	14,000	4,456	9,544	1,145	8,399	1,008	7,391	886.90	6,503.97	780.48	5,723.49	686.82	5,036.67	604.40	4,432
31	බිත්ති ඔරලෝසු	12/31/2010	1	600	135	465	56	409	49	360	43.21	316.88	38.03	278.86	33.46	245.40	29.45	216
32	මොබිටෙල් ඩොන්ගල්	7/19/2012	1	4,065	-	4,065	488	3,577	429	3,148	377.75	2,770.18	332.42	2,437.76	292.53	2,145.23	257.43	1,888
33	බයිසිකලය	9/7/2013	1	10,845	-		-	10,845	1,301	9,544	1,145.23	8,398.37	1,007.80	7,390.56	886.87	6,503.70	780.44	5,723
34	වතුර /පිල්වරය	9/7/2013	1	8,600	-		-	8,600	1,032	7,568	908.16	6,659.84	799.18	5,860.66	703.28	5,157.38	618.89	4,538

35	hp පරිගණකය	31/12/2014	1	119,900						119,900	14,388.00	105,512.00	12,661.44	92,850.56	11,142.07	81,708.49	9,805.02	71,903
36	ENT set	31/12/2014	4	140,000						140,000	16,800.00	123,200.00	14,784.00	108,416.00	13,009.92	95,406.08	11,448.73	83,957
37	බර කිරන තරාදි(Weight scale)	31/12/2014	2	4,000						4,000	480.00	3,520.00	422.40	3,097.60	371.71	2,725.89	327.11	2,399
38	විදුලි පංකා (Ceiling)	31/12/2014	7	24,430						24,430	2,931.60	21,498.40	2,579.81	18,918.59	2,270.23	16,648.36	1,997.80	14,651
39	විදුලි පංකා (Pedestal)	31/12/2014	7	33,250						33,250	3,990.00	29,260.00	3,511.20	25,748.80	3,089.86	22,658.94	2,719.07	19,940
40	පුටු (rotating)	31/12/2014	4	37,632						37,632	4,515.84	33,116.16	3,973.94	29,142.22	3,497.07	25,645.15	3,077.42	22,568
41	ඇඳි පුටු (Fabric Cushion)	31/12/2014	31	159,712						159,712	19,165.44	140,546.56	16,865.59	123,680.97	14,841.72	108,839.26	13,060.71	95,779
42	වානේ අල්මාරි	31/12/2014	3	43,680						43,680	5,241.60	38,438.40	4,612.61	33,825.79	4,059.10	29,766.70	3,572.00	26,195
43	ඇඳි පුටු (ප්ලාස්ටික්)	31/12/2014	15	15,120						15,120	1,814.40	13,305.60	1,596.67	11,708.93	1,405.07	10,303.86	1,236.46	9,067
44	තේක්ක මෙස(5 * 3)ලාච්චු2	31/12/2014	1	19,600						19,600	2,352.00	17,248.00	2,069.76	15,178.24	1,821.39	13,356.85	1,602.82	11,754

45	නාම පුවරු	23/08/2017	7	259,990												259,990.00		259,990
46	පරිගණක මේසය	30/12/2017	1	13,512												13,512.00		13,512
47	විධායක මේස	30.12.2017	2	147,311												147,311		147,311
48	ලිපිගොනු රාක්ක	30.12.2017	2	29,629												29,629		29,629
49	තේක්ක ඩෙස්ක් පුටු	30.12.2017	6	64,971												64,971		64,971
50	තේක්ක වැල් පුටු	30.12.2017	4	140,412												140,412		140,412
51	විධායක පුටු	30.12.2017	3	60,375												60,375		60,375
52	පරිගණක ය	30.12.2017	1	116,000												116,000		116,000
				3,155,516	598,795	1,107,752	132,930	994,267	119,312	1,472,279	176,673.45	1,295,605	155,473	1,140,133	136,816	1,635,517	120,398	1,715,119

හෝමියෝපති වෛද්‍ය සභාව

ස්කන්ධය වෙනස්වීම්	සංචිත රු.
2017.01.01 දිනට ශේෂය	2,562,144
රජයේ ප්‍රාග්ධන ප්‍රතිපදනය	5,677,925
පෙර වර්ෂ ගැලපුම්	27,460
සමුච්චිත ඌනතාවය / අතිරික්තය	(893,263)
2017.12.31 දිනට ශේෂය	**7,374,266**

12. විගණන වාර්තාව

මෙම වසරේදී හෝමියෝපති වෛද්‍ය සභාවේ කටයුතු මෙහෙයවනු ලැබුවේ 2016 අංක 10 දරණ හෝමියෝපති පනත යටතේ පිහිටවනු ලැබූ ප්‍රථම පාලක සභාව වූ හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව විසිනි. සභාවේ ගිණුම් කටයුතු රේඛීය අමාත්‍යාංශය වූ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ දේශීය වෛද්‍ය අංශය විසින් මෙහෙයවනු ලැබීය.

2016 අංක 10 දරණ නව හෝමියෝපති පනත බලාත්මක කිරීම සඳහා අවශ්‍ය රීති හා රෙගුලාසි සම්පාදනය සිය ප්‍රධාන වගකීම ලෙස ගත් අතුරු වෛද්‍ය සභාව ගරු අමාත්‍යතුමා විසින් සාදනු ලබන නියෝග කෙටුම්පත් කර ඉදිරිපත් කිරීමට ප්‍රමුඛ අවධානයෙන් කටයුතු කළේය.

වෛද්‍ය සභාව මගින් පවත්වාගෙන යනු ලබන රජයේ හෝමියෝපති සායන 7 හි පුරප්පාඩුව පැවති කාර්යාල සහායක තනතුරු 7 සඳහා බඳවා ගනිමින් වෛද්‍ය සභාවේ ආයතනික ව්‍යුහය ශක්තිමත්ව පුළුල් කිරීමට මෙම වසරේ දී ක්‍රියා කරනු ලැබීය. හෝමියෝපති උපාධිධාරී නව වෛද්‍යවරුන් 4 දෙනෙකුට ලියාපදිංචිය ලබා දී මෙතෙක් හෝමියෝපති වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව 281 දක්වා වර්ධනය කර ගන්නා ලදී.

මේ ආකාරයට වෛද්‍ය සභාවේ සමස්ත කාර්ය භාරය සම්බන්ධයෙන් ගත් කල ආයතනය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පරිපාලන හා මූල්‍යමය ක්‍රියාවලීන් මූලික වශයෙන් විගණකාධිපති වරයාගේ වාර්තාව මඟින් ඇගයීමට ලක්ව ඇත.

වෛද්‍ය චන්දන වීරසේකර
සභාපති
හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව

සුභාශිංසන

★ ★ ★ ★

ගරු සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය තුමා

ගරු නියෝජ්‍ය අමාත්‍ය තුමා

ලේකම් සහ අතිරේක ලේකම් වරුන්

හෝමියෝපති වෛද්‍ය සභා සාමාජික සාමාජිකාවන්

නීතිපති දෙපාර්තමේන්තුව

විගණකාධිපති දෙපාර්තමේන්තුව

හෝමියෝපති වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරී

හා

කාර්ය මණ්ඩලය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එච්එස්එම්/බී/එච්එම්සී/1/17/04 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2018 අගෝස්තු 15 දින

සභාපති,

හෝමියෝපති වෛද්‍ය සභාව.

හෝමියෝපති වෛද්‍ය සභාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

හෝමියෝපති වෛද්‍ය සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2016 අංක 10 දරන හෝමියෝපති පනතේ 40(3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI -1000- 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම්වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට හෝමියෝපති වෛද්‍ය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7

ප්‍රමිතයේ 69 ඡේදය ප්‍රකාරව වත්කමක ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය පාවිච්චි කිරීමට සුදානම් තත්ත්වයට ගෙන ආ පසුව වුවත් ඊට අනුකූල නොවන ලෙස සභාව විසින් වත්කම් මිලදී ගත් දිනය නොසලකා එම මිලදී ගත් වර්ෂය සඳහා සම්පූර්ණයෙන්ම ක්ෂය කිරීම් හා ඉවත් කරන වර්ෂයේදී ක්ෂය නොකිරීමේ ප්‍රතිපත්තිය අනුගමනය කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 8

ප්‍රමිතයේ 100 ඡේදය ප්‍රකාරව, සභාවට එරෙහිව පවතින නඩු 5 ක් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඖෂධ ඇසිරීම සඳහා මිලදී ගනු ලබන ඖෂධ බහාලුම් ඩප්පි හා කවර සඳහා දරනු ලබන පිරිවැය මිලදී ගනු ලබන වර්ෂයේදීම වියදමක් ලෙස කපා හැරීම සිදුකර තිබුණි. එබැවින් ඉකුත් වර්ෂයේදී මිලදීගෙන සමාලෝචිත වර්ෂය තුලදී පාරිභෝජනය කරන ලද පිරිවැය රු.233,000 ක්වූ ඖෂධ බහාලුම් හා ඩප්පි වර්ෂයේ වියදමක් ලෙස සටහන් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. එසේම 2017 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.685,300 ක්වූ ඉතිරි තොගය ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ජංගම වත්කම්ද එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සේවකයින් 19 දෙනෙකුගේ සම්පූර්ණ සේවා කාලය වෙනුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට සැලසිය යුතු පාරිතෝෂික ප්‍රතිපාදනය රු.840,650 ක් වුවද ඒ වෙනුවට රු.497,614 ක් ප්‍රතිපාදනය කර තිබීම හේතුවෙන් පාරිතෝෂික ප්‍රතිපාදනය රු.343,036 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

(ඇ) විභාග ගාස්තු වශයෙන් 2014 වර්ෂයේදී සභාව වෙත ලැබී තිබුණු රු.195,900 ක් සභාව නමින් වූ ජංගම ගිණුමට බැර නොකර සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් නමින් පවත්වා තිබුණු ජංගම ගිණුමකට බැර කර තිබුණි. ඒ අනුව එම ආදායම රජයේ ආදායමට බැරවී තිබුණු බැවින් තවදුරටත් එය සභාවේ වත්කමක් නොවන නමුත් එම වටිනාකම වත්කමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) හෝමියෝපති වෛද්‍ය සභා කාර්යාලය සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් ගොඩනැගිල්ලක පවත්වාගෙන යනු ලබන අතර එම ගොඩනැගිල්ල සහ භූමියේ හිමිකම එම සභාව සතුව නොතිබුණු නමුත්, 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී එම ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම වෙනුවෙන් වැයකර තිබුණු රු.4,227,506 ක් ජංගම නොවන වත්කම් යටතේ ප්‍රාග්ධන ගත කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළදී මිලදීගෙන තිබුණු පිරිවැය රු.259,990 ක් වූ නාම පුවරු 7 ක ක්ෂය රු.31,199 ක් ගිණුම්ගත කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.430,427 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.422,515 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.7,912 ක අඩුවීමක් දක්නට ලැබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රජයේ පුනරාවර්තන ප්‍රතිපාදන රු.1,189,976 කින් හා මුළු වියදම් රු.1,209,301 කින් වැඩිවීම ඉහත සඳහන් අඩුවීම සඳහා ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 හා 2014 වර්ෂවල පිළිවෙලින් රු.111,977 ක් හා රු.170,636 ක් වූ ඌනතාවය 2015 වර්ෂයේදී රු.271,598 ක අතිරික්තයක් වී තිබුණු අතර 2016 හා 2017 වර්ෂවල නැවතත් පිළිවෙලින් රු.422,515 ක හා රු.430,427 ක ඌනතාවයන් ඇති වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය ගැලපීමේදී 2013 වර්ෂයේදී රු.4,873,487ක් වූ දායකත්වය 2015 වර්ෂයේදී රු.9,951,274 ක් දක්වා එනම් සියයට 6 සිට සියයට 93 අතර උච්චාවචනයක් සහිතව වර්ධනය වී තිබුණු අතර 2016 හා 2017 වර්ෂවලදී පිළිවෙලින් රු.10,015,998 ක් හා රු.11,662,324 ක් දක්වා වර්ධනය වී තිබුණි.

3.2 ආයතනයට එරෙහිව ඇති නෛතික සිද්ධි

වෛද්‍ය සභාවේ සේවය කළ වෛද්‍යවරයෙකු හා කම්කරුවෙකු සේවයෙන් ඉවත් කිරීමට එරෙහිව පිළිවෙලින් රු.මිලියන 3 ක් හා රු.මිලියන 2 බැගින් වන්දි ඉල්ලා නඩු පවරා තිබුණි. ඊට අමතරව, හිඟ වැටුප් ගෙවීම හා වෛද්‍ය සභාව විසුරුවා හැරීමෙන් පසු සිදුකළ පත්කිරීම් හා ලියාපදිංචි කිරීම් බල රහිත කරන ලෙස ඉල්ලා වෛද්‍යවරු දෙදෙනෙකු විසින් සභාවට එරෙහිව නඩු 2 ක් පවරා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලසුම් කිරීම

හෝමියෝපති වෛද්‍ය වෘත්තියෙහි යෙදීම ප්‍රවර්ධනය, අභිවර්ධනය කිරීම හා නියාමනය කිරීම, හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳ පර්යේෂණ කිරීම හා ප්‍රවර්ධනය කිරීම, ඖෂධ වර්ග සහ වෙනත් පිළියෙල කිරීම් නිෂ්පාදනය, විකිණීම හා බෙදාහැරීම නියාමනය කිරීම හා පාලනය කිරීම යන ප්‍රධාන අරමුණු ඉටුකරගැනීමට අදාළ සැලසුම් ඇතුළත් කර සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙලකර නොතිබුණි.

4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

2016 අංක 10 දරන හෝමියෝපති පනත ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය තුළදී සභාවේ අරමුණු ඉටුකර ගැනීම පිළිබඳව සිදුකරන ලද පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 අංක 10 දරන හෝමියෝපති පනතේ 30 වගන්තිය ප්‍රකාරව, හෝමියෝපති වෛද්‍යවරු ලියාපදිංචිය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට 2016 නොවැම්බර් 04 දින පැවති අතුරු වෛද්‍ය සභා රැස්වීමේදී තීරණයකර තිබුණද 2018 මැයි 31 දිනවන විටත් ඒ සඳහා අවශ්‍ය නීති සම්පාදනය කර නොතිබුණි.

(ආ) සභාව විසින් පවත්වන සායන 7 න් සායන 4 ක් සඳහා රෝගීන්ගේ සහභාගීත්වය අඩුවී තිබුණු අතර එම අඩුවීම පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 4 සිට සියයට 25 දක්වා පරාසයක විය. සායන 3 ක රෝගී සහභාගීත්වය වැඩිවී තිබුණු අතර එම වැඩිවීම පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 6 සිට සියයට 20 දක්වා විය.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙලකර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතුකර නොතිබුණු අවස්ථා පහත පරිදි විය.

(i) පනතේ විධිවිධාන යටතේ හෝමියෝපති සෞඛ්‍ය සේවා සපයන ආයතන ලියාපදිංචි කිරීම හා රජයේ හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කිරීමට අවශ්‍ය රෙගුලාසි ප්‍රකාශයට පත්කිරීම යන අරමුණු ඉටුකරගැනීමට කටයුතුකර නොතිබුණි. තවද, හෝමියෝපති පනතේ විධිවිධාන බලාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී නීති රීති හා රෙගුලාසි ප්‍රකාශයට පත්කර පාර්ලිමේන්තුවේ සම්මත කරගැනීමට සැලසුම්කර තිබුණද නියෝග හා රීතීන් 3ක් කෙටුම්පත් කිරීම පමණක් සිදුකර තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළදී විභාගයක් පවත්වා හෝමියෝපති වෛද්‍යවරු ලියාපදිංචි කිරීමට සැලසුම්කර විභාගය පැවැත්වීම සඳහා අයදුම්පත් කැඳවා තිබුණු නමුත් විභාගය පවත්වා නොතිබුණු අතර වෛද්‍යවරු ලියාපදිංචි කිරීමද සිදුකර නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය තුළදී හෝමියෝපති ඖෂධ ආනයනය කර බෙදාහැරීමට සැලසුම්කර තිබුණද ඖෂධ ආනයනය කිරීමේ ඉල්ලුම්පත් 7 කට අනුමැතිය ලබාදීම පමණක් සිදුකර තිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2009 වර්ෂයේදී පැවති අතුරු වෛද්‍ය සභාව විසින් පැවැත්වීමට සැලසුම්කර තිබුණු පාඨමාලාවක් සඳහා ගාස්තු ලෙස අයකර ගත් මුදල් පෞද්ගලික බැංකුවක තැන්පත්කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එම ගිණුමෙහි ශේෂය රු.1,702,684 ක් විය. සැලසුම් කළ පරිදි අදාළ පාඨමාලාව පවත්වා නොතිබුණු අතර එම මුදල් තැන්පත්කරුවන් වෙත ආපසු ගෙවිය යුතු බවට අතුරු වෛද්‍ය සභාව තීරණයකර තිබුණද තැන්පත්කරුවන් පිළිබඳ තොරතුරු හා අයකර ගත් මුදල කොපමණද යන්න පිළිබඳ තොරතුරු කිසිවක් සභාව සතුව නොතිබුණි.

(ආ) 2016 අංක 10 දරන හෝමියෝපති පනතේ 51(2) වගන්තිය ප්‍රකාරව, අමාත්‍යවරයා විසින් පත්කරන ලද අතුරු වෛද්‍ය සභාව මෙම පනත ක්‍රියාත්මක දිනයේ සිට වර්ෂ දෙකක් තුළ සභාව පිහිටුවන තුරු සභාවේ කාර්යයන් ඉටු කරනු ලැබිය යුතුය. එහෙත් පනතේ 51(3) වගන්තිය අනුව අමාත්‍යවරයා විසින් අතුරු වෛද්‍ය සභාව පත්කරනු ලැබිය යුතු වන්නේ නියමිත දිනයෙන් ආරම්භවන මාස තුනක කාලයක් සඳහාය. ඒ අනුව අතුරු වෛද්‍ය සභාවේ වලංගු කාලය පිළිබඳ පනතේ එක් එක් වගන්තිවල නොසැසඳීම් නිවැරදි කර ගැනීමට කළමනාකාරිත්වය පියවර ගෙන නොතිබුණි.

4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

හෝමියෝපති වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමේ ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණු අතර 2016 වර්ෂයේදී ලියාපදිංචි වී තිබුණු වෛද්‍යවරුන් 8 දෙනෙකුගේ නම් ගැසට් පත්‍රය මගින් නිවේදනයකර නොතිබුණි.

4.4 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

මහජන අරමුදල් රැස්කිරීම සඳහා බලයක් ලැබෙන කිසිදු ප්‍රතිපාදනයක් නොමැතිව හා විධිමත් අනුමැතියක් නොමැතිව "හෝමියෝපති අරමුදල" නමින් එකක් රු.50 ක වටිනාකමක් සහිත ආධාර පත්‍ර 100 ක් අඩංගු ආධාර පත්‍ර පොත් මුද්‍රණයකර තිබුණු අතර මුද්‍රණය කළ මුළු ආධාර පත්‍ර සංඛ්‍යාව, මුද්‍රණය කළ වර්ෂය, ආධාර පත්‍ර අලෙවි ආදායම හා එම මුදල් බැංකුගත කිරීම පිළිබඳ තොරතුරු කිසිවක් සභාව සතුව නොතිබුණි. 2018 අප්‍රේල් 26 දින වන විට ඉන් පොත් 417 ක තොගයක් ඉතිරිව පැවතුණි. පැවති පහළම පොත් අංකය හා ඉහළම පොත් අංකය අතර පොත් 162 ක හිඟයක් පැවති අතර එමගින් රැස්කළ හැකිව තිබුණු මුළු මුදල රු.810,000 ක් විය.

4.5 නිශ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්

හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කිරීම සඳහා 2008 වර්ෂයේදී ගොඩනැගිල්ලක් ඉදිකර 2009 වර්ෂයේදී ලී බඩු හා උපකරණ සපයාගෙන තිබුණද, එහි අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට අදාළ නීතිමය රාමුව පිළියෙල කිරීමට පියවර ගෙන නොතිබීම හේතුවෙන් 2018 මැයි 31 දින වන විටත් අධ්‍යයන කටයුතු ආරම්භකර නොතිබුණි. ඒ අනුව මිලදී ගෙන තිබුණු පිරිවැය රු.1,199,254 ක් වූ ස්ථාවර වත්කම් හා ඊට අදාළ ගොඩනැගිල්ල වර්ෂ 07 ට අධික කාලයක් තිස්සේ නිෂ්කාර්යව පැවතුනි.

4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1970 අංක 07 දරන හෝමියෝපති පනතේ 20(2) හා 20(3) වගන්ති ප්‍රකාරව, භාණ්ඩාගාර ලේකම්ගේ හා සභාවේ කැමැත්ත පරිදි අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරයෙකු තාවකාලික වශයෙන් සභාවේ ලේඛකාධිකාරී තනතුරට පත්කළ යුතු වුවත්, අතුරු පාලක සභාව විසින් අමාත්‍යාංශයෙන් පරිහාහිර තැනැත්තෙකු වර්ෂ 3 ක පරිවාස කාලයකට යටත්ව 2012 ඔක්තෝබර් 16 දින ලේඛකාධිකාරී තනතුර සඳහා ස්ථිර පදනමින් බඳවා ගෙන තිබුණි.

(ආ) ඖෂධ සංයෝජකවරුන් සඳහා අනුමත බඳවාගැනීම් පරිපාටියේ 4.4 ඡේදය ප්‍රකාරව, සේවයෙහි ස්ථිර කිරීම සඳහා තනතුරට පත්කර වර්ෂ 3 ක් ගතවීමට පෙර කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්විය යුතු වුවද 2014 ඔක්තෝබර් 24 දින සිට ස්ථිර පදනමින් බඳවා ගෙන තිබුණු ඖෂධ සංයෝජකවරුන් 07 දෙනෙකු සේවයෙහි ස්ථිර කිරීම සඳහා අදාල කාර්යක්ෂමතා කඩඉම් විභාගය පැවැත්වීමට 2017 දෙසැම්බර් 31 දින වන විටත් පියවර ගෙන නොතිබුණි.

5. තිරසර සංවර්ධනය

5.1 තිරසර සංවර්ධන අරමුණු ළඟා කරගැනීම

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව වෛද්‍ය සභාව විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

6.1 අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව, සභාව සඳහා අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණු අතර සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් හෝ අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

6.2 අයවැය ලේඛනමය පාලනය

2003 ජුනි 02 දිනැති හා අංක පී‍ඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 වගන්තිය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ ආදායම් හා වියදම් සම්බන්ධ ඇස්තමේන්තුගත අයවැය ලේඛනයක් පිළියෙලකර එය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගැනීමට කටයුතුකර නොතිබුණි.

7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදි. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර කෙරෙහි කළමනාකාරීත්වයේ විශේෂ අවධානය යොමුවිය යුතුය.

පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ) ගිණුම්කරණය	සියලුම වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් ඇතුළත්ව ලෙජර් ගිණුම් පවත්වාගෙන ගොස් නොතිබීම හා ගැලපීම් සඳහා ජර්නල් සටහන් ලියා නොතිබීම.
(ආ) පාරිභෝජන ද්‍රව්‍ය තොග පාලනය	ඖෂධ බහාලුම් ඩප්පි හා කවර තොග භෞතික සමීක්ෂණයට ලක්කර නොතිබීම හා එම තොග පිළිබඳ නිවැරදි ගිණුම් තැබීමක් සිදුකර නොතිබීම.

(ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය — අනුමත බඳවාගැනීම් පරිපාටි හා රෙගුලාසි අනුව හෝමියෝපති වෛද්‍ය විෂයානුගත කාර්ය මණ්ඩලය සඳහා බඳවාගැනීම් සිදුනොකිරීම.

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති.